**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත්බද බලපිටිය මහාධිකරණයේදීය.**

මහාධිකරණ විනිසුරු නාමල් බණ්ඩාර බලල්ලේ මැතිතුමන් ඉදිරිපිට දී.

නඩු අංකය - එච්.සී.බී.1242/2009 දිනය- 2018.05.30

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

විරුද්ධව

1. කාරියවසම් දොන් සමන් පාලිත අතුකෝරල
2. රණසිංහගේ ජයරත්න අප්පුහාමි
3. ඩිලාන් වික්‍රම ඉන්දික ද සිල්වා.

**තීන්දුව**

මෙම නඩුවේ 01,02,03 චූදිතයින් පිලිවෙලින් කාරියවසම් දොන් සමන් පාලිත අතුකෝරල, රණසිංහගේ ජයරත්න අප්පුහාමි සහ ඩිලාන් වික්‍රම ඉන්දික ද සිල්වා වේ. මෙම අය මින් ඉදිරියට පිළිවෙලින් 01,02,03 චූදිතයින් ලෙස හඳුන්වයි. නඩුවේ 01,02,03 චූදිතයින් ට එරෙහි ව ඇති අධිචෝදනාවන් මෙසේ ය. එනම්,

01,02,03 චූදිතයින් විසින් වර්ෂ 2008 ක් වූ ජූනි මස 07 වන දින හෝ ඊට ආසන්න දිනයක දී බලපිටිය අධිකරණයේ බලසීමාව තුල පිහිටි කහව හි දී, කාරියවසම් බ්‍රැන්ඩිගොඩ ගමගේ කමල් ප්‍රියන්ත යයන අය , ඔහු විසින් කරන ලද හෝ කරන ලදැයි සැකකරන යම් ක්‍රියාවක් එනම්, බීමත් ව කලහකාරී ලෙස හැසිරීම සම්බන්ධයෙන් දඬුවම් කිරීම සඳහා සහ/ හෝ ඔහු ව බියගැන්වීම සඳහා එකී කාරියවසම් බ්‍රැන්ඩිගොඩ ගමගේ කමල් ප්‍රියන්ත යන අය ට වධ දුන් බැවින් චූදිතයින් 1994 අංක 22 දරණ වධ දීම ට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීම ට හෝ දඬුවම්වල ට එරෙහිවවූ සම්මුතිය පනතේ 2 (1) වගන්තිය යටතේ වරදක් සිදු කල බැවින් චූදිතයින් එකී පනතේ 2(4) වගන්තිය ප්‍රකාර ව දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කල බවට ද,

ඉහත සඳහන් වේලාවේ දී, ස්ථානයේ දී හා එම ක්‍රියා කලාපයේ දී ම චූදිතයින් ඉහත කී කාරියවසම් බ්‍රැන්ඩිගොඩ ගමගේ කමල් ප්‍රියන්ත යන අය ට තුවක්කු බඳකින් පහර දී බරපතල තුවාල

13 MAY 2019

සිදු කිරීමෙන් 1995 අංක 22 දරණ පනතින් සංශෝධිත දණ්ඩ නීති සංග්‍රහයේ 32 වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ 316 වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කල බවට ද වේ.

ඉහත කී අධිචෝදනාවෙන් සනාථ කිරීම සඳහා පැමිණිල්ල විසින් පැමිණිල්ලේ පළමු සාක්ෂිකාර කාරියවසම් බ්‍රැන්ඩිගොඩ ගමගේ කමල් ප්‍රියන්ත, පැමිණිල්ලේ පස්වන සාක්ෂිකාර සම්මුවාහන්දි ප්‍රසන්නද සිල්වා, පැමිණිල්ලේ හතරවන සාක්ෂිකාර කිරාහංදි චමීර සිල්වා, පැමිණිල්ලේ දෙවන සාක්ෂිකාර හපුතන්ත්‍රිගේ විමලාවතී,පැමිණිල්ලේ එකලොස් වන සාක්ෂිකාර අධිකරණ වෛද්‍ය නිලධාරී රත්නවීර හේවාවිතාරණගේ අජිත් ඉංදික රත්නවීර, පැමිණිල්ලේ දොලොස්වන සාක්ෂිකාර ස්ථානාධිපති, පොලිස් ස්ථානය, මීටියාගොඩ, හදගල දේවගේ පියපාල , පැමිණිල්ලේ අටවන සාක්ෂිකාර ගෝනපීනුවල විතානගේ සුජිත්(පොලිස් කොස්තාපල් 45430 සුජිත්) පැමිණිල්ලේ නමවන සාක්ෂිකාර විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පින්තේරු මහවඩුගේ අර්ඩ්ලි කැමිලස් ප්‍රනාන්දු (සහකාර පොලිස් අධිකාරී අර්ඩ්ලි ප්‍රනාන්දු) පැමිණිල්ලේ දහවන සාක්ෂිකාර අධිකරණ රෙජිස්ට්‍රාර්. කැඳවමින් ද, පැ. 01 ලෙස අනුක්‍රමික අංක ඒ.ආර්/එෆ්.එම්./08/323 හා 2008.06.07 දිනැති අධිකරණ වෛද්‍ය වාර්තාව ද, පැ.02 ලෙස පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ට අදාල ඇඳ ඉහපත් ලේඛන ද. පැ.02A ලෙස, පැමිණිල්ලේ එකොලොස්වන සාක්ෂිකරු ගේ සටහන් සහ අත්සන ද, පැ.03A සිට E දක්වා සටහන් උධෘතයන් ද ඇතුළුව පැ.1 සිට පැ.04 දක්වා ලේඛණ ලකුණු කරමින් පැමිණිල්ලේ නඩුව අවසන් කරන ලදි.

විත්ති වාචක කැඳවීමේ දී, 01 චූදිත ද, 03 වන චූදිත ද, 03 චූදිත වෙනුවෙන් පොලිස් පරික්ෂක ගල්පාතගේ ශ්‍රී නිශ්ශංක යසරත්න සහ දලුවතු මුල්ල ගමගේ සුනිල් කුමාර යන සාක්ෂිකරුවන් කැඳවමින් ද 1.වි1 සිට ලේඛණ සහ පරස්පරතා ද, 1වි 23 ලෙස පැ.01 හි 2012.03.10 දින අධිකරණය ට ඉදිරිපත් කල වාර්තාව ද එකී ලේඛණයේ රෝගියා විසින් දෙන ලද ඉතිහාසය ද ලකුනු කරමින් විත්තියේ නඩුව අවසන් කරන ලදි. දෙවන චූදිත වෙනුවෙන් සාක්ෂි කැඳවීමක් හෝ සාක්ෂි ලබා දීමක් සිදු නොකරන ලදි.

2013.10.15 වන දින සිට 2013.12.02 දක්වා කාලය ඇතුලත මුල් පූර්වගාමී විනිසුරුතුමන් පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගේ සාක්ෂිය අවසන් කර ඇත. නමුත් 2014.01.27 දින ආසන්නතම පූර්වගාමී විනිසුරුතුමා ගේ නියෝග මත පැමිණිල්ලේ පලමු සාක්ෂිකරු නැවත කැඳවීම ට තීරණය කරන ලදින්,පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ සාක්ෂිය 2014.02.05 දින සිට 2014.02.13 දක්වා කාලය තුල නැවත සටහන් කර ඇත. නඩු විභාගය අවසන දෙපාර්ශවය වෙනුවෙන්ම අධිකරණය අමතා සිය ස්ථාවරයන් ඉදිරිපත් කල අතර ඉහත සියළු කරුණු මෙම තීන්දුවේ දී සලකා බලනු ඇත.

සම්පූර්ණ සාක්ෂි සටහන් කිරීමේ දි ඒ අනුව පූර්වගාමී විනිශ්චයකාරතුමා ඉදිරියේ සටහන් කල අතර, එතුමා ට නඩුව ඉදිරිය ට ගෙන යාම හා සම්බන්ධ ව ඇති වූ නොහැකියාව මත ගරු අගවිනිසුරුතුමා ගේ J.C.261/88 හා 7.12.2017 දරණ පත් කිරිම මගින් මෙම නඩුවේ සාක්ෂි අසා නිම කිරීම ට මා හට බලය පවරන ලදි. ඒ අනුව මා ඉදිරියේ 2018.03.15 දින 03 වන චූදිත වෙනුවෙන් සාක්ෂිකරුවකු කැඳවීම පමණක් සිදු කරන ලදි. පෙර සඳහන් කල පරිදි වූ බලය පිට

13 MAY 2019

පූර්වගාමී විනිශ්චයකාරතුමා ඉදිරියේ සටහන් කල සාක්ෂි, මා ඉදිරියේ අනුකූල කර ගැනීම ට ද පාර්ශවකරුවන් එකඟ වී ඇත. සාක්ෂි සටහන් පරිශීලනය කිරීමේ දී අධිකරණය මගින් කල ප්‍රශ්න කිරීම් ද, හඳුනා ගත හැකි විය. එකී ප්‍රශ්න කිරීම් මගින් හෙළිදරව් වන කරුණු පැමිණිල්ල වෙනුවෙන් හෝ චූදිතයින් වෙනුවෙන් සලකා බලන්නේ සාක්ෂි ආඥා පනතේ 165 වගන්තිය යටතේ වන කරුණු පැහැදිලි කිරීම් සඳහා අදාලතා පමණක් බවට ද සටහන් කර තබමි.

නඩුවේ පළමු අධි චෝදනාව 1994 අංක 22 දරණ වද දීම සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහි ව වූ සම්මුතිය පනතේ 2 (1) වගන්තිය යටතේ වරදක් සිදු කර 2 (4) වගන්තිය යටතේ චූදිතයන් දඬුවම් ලැබිය හැකි වරදක් කල බව ට වේ. පනතේ 2 (1) වගන්තිය මෙසේය.

2. (1) වෙනත් යම් තැනැත්තෙකු ට වද දෙන යම් තැනැත්තෙකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය. පනතේ 2(4) [1] වගන්තිය දඬුවම් වගන්තිය යි. ඉහත පනතේ අර්ථ නිරූපන වගන්තිය 12 වෙනි වගන්තිය යි. 12 වෙනි වගන්තියේ වද දීම යන්න පැහැදිලි කර ඇත. එකී පැහැදිලි කිරීම් මෙසේය.

"වදදීම" යන්නෙහි ව්‍යාකරණානුකූල ව වෙනස්වීම් සහ සජාතීය යෙදුම් ඇතුළුව "වධදීම" යන්නෙන් වෙනත් යම් තැනැත්තකු ට දැඩි ශාරීරික හෝ මානසික වේදනා ගෙන දෙන්නා වූ ද (අ) පහත දැක්වෙන කාර්යයන් සඳහා.

එනම්,

1. එකී වෙනත් තැනැත්තාගෙන් හෝ තුන්වන තැනැත්තාගෙන් යම් තොරතුරක් හෝ පාපොච්චාරණයක් ලබා ගැනීමට හෝ
2. එකී වෙනත් තැනැත්තා හෝ තුන්වන තැනැත්තා විසින් කරන ලද හෝ කරන ලදැයි සැක කෙරෙන යම් ක්‍රියාවක් සඳහා ඒ තැනැත්තාට දඬුවම් කිරීම සඳහා වූ ද
3. එකී වෙනත් තැනැත්තා හෝ තුන්වන තැනැත්තකු බිය ගැන්වීම හෝ ඔහුට බල කිරීම සඳහා

(ආ) වෙනස්කම් කිරීම මත පදනම් වූ වෙනත් හේතුවක් නිසා කරන්නා වූ ද
සෑම අවස්ථාවකදීම රජයේ නිලධරයකු හෝ නිල තත්වයකින් කටයුතු කරන වෙනත් තැනැත්තකු විසින් හෝ එම නිළධරයාගේ හෝ තැනැත්තාගේ මුල්වීමෙන් හෝ කැමැත්ත ඇතිව හෝ එම නිළධරයාගේ හෝ තැනැත්තාගේ විරුද්ධ නොවීම මත කරන්නා වූ ද යම් ක්‍රියාවක් අදහස් වේ.

පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ ස්ථාවරය පරිදි පැමිණිල්ලේ නඩුව ඔප්පු කල හැකි වුවහොත් ඔහු පැහැදිලි කරීමට උත්සාහ කරන වරද පනතේ 12(අ) 3 වයතට ගැනේ. ඒ අනුව අඩු තරමින් එකී වගන්තිය ප්‍රකාර ව හෝ එසේ නැතහොත් 12(අ)(2) වගන්තිය ප්‍රකාරව චූදිතයන් විසින් වරදක් සිදු කර ඇති බව සහ දෙවන අධි චෝදනාව ට අදාලව ද පැමිණිල්ල සිය නඩුව සනාථ කර

---

[1] 2.4 වගන්තිය පනත යටතේ වරදකට වරදකරු වන තැනැත්තෙකු මහාධිකරණය විසින් නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට අවුරුදු හතකට නොඅඩු සහ අවුරුදු දහයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කරනු ලැබීමට සහ රුපියල් දසදහසකට නොඅඩු සහ පනස් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

13 MAY 2019

ඇත්ද යනන විමසා බැලිය යුතු ය. නඩුවේ 02 වන අධි චෝදනාව දණ්ඩ නීති සංග්‍රහයේ 316 වගන්තිය [2] යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකල බවට වේ.

දණ්ඩ නීති සංග්‍රහයේ 316 වගන්තියේ දැක්වෙන බරපතල තුවාලකිරීම 1995 අංක 22 දරන පනතින් සංශෝධිත දණ්ඩ නීති සංග්‍රහයේ 311 වගන්තිය [3]මගින් පැහැදිලි කරයි. නඩුවේ පළමු සාක්ෂිකරු ට සිදු වූ බව ට කියා සිටින හානිය අනුව ඔහුගේ තුවාලය ඉහත 311 වගන්තියේ 02 වෙනි 04 වෙනි සහ 05 වෙනි එනම් එක් ඇසක පෙනීම නිත්‍ය ලෙස නැති කිරිම, යම් අවයවයක් හෝ ග්‍රන්ථියක් විනාශ කිරිම, යම් අවයවයක් හෝ ග්‍රන්ථියක බලය විනාශ කිරීම හෝ නිත්‍ය ලෙස දුර්වල කිරීම යනාදී තුවාලයන් යටත ට ගැනෙන අතර මෙයින් දෙවෙනි කාරණය වන එක් ඇසක පෙනීම නිත්‍ය ලෙස නැති කිරීම යන අංගය ප්‍රබල ය.

මෙම නඩුවේ පැමිණිල්ලේ එකොලොස්වන සාක්ෂිකරු ලෙස කැඳවන ලද්දේ, රුහුණු විශ්ව විද්‍යාලයේ අධිකරණ වෛද්‍ය දෙපාර්තමේන්තුවේ කථිකාචාර්ය වරයෙකු වූ රත්නවීර හේවාවිතාරණගේ සුජිත් ඉන්දික රත්නවීර යන අය යි. පැ.01,පැ.02 මෙන්ම, 1වී.23 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාවේ පිටපත ද, ලකුණු කරන ලද්දේ මෙම සාක්ෂිකරු මගිනි. පැ.01 සහ 1වී.23 ලේඛන මෙම සාක්ෂිකරු විසින් සකස් කරන ලද ලේඛන වේ. සාක්ෂියේ දී සාක්ෂිකරු ගේ සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳව ප්‍රථමයෙන් ම සාක්ෂි මෙහෙයවන ලද අතර, චූදිතයන් වෙනුවෙන් සාක්ෂිකරු ගේ සුදුසුකම් සහ පළපුරුද්ද හබ කර සිටියේ නැත. පැ.02 ලෙස ලකුණු කිරීම ට යෙදුනු ඇඳ ඉහපත් ලේඛන සළකුණු කිරීම සම්බන්ධයෙන් 01,02 චූදිතයන් වෙනුවෙන් නගන ලද විරෝධතාවය මත එම ලේඛනයන් හි පැවැත්ම පිළිබඳ ව සාක්ෂි ආඥා පනතේ 33 (2) වගන්තිය යටතේ තහවුරු කිරීම ට පැමිණිල්ලට අවසර දී ඇත.[4] ඒ අනුව එම ඇඳ ඉහපත් රාජකාරිමය වශයෙන් සකස් වන ආකාරය සහ ඊට දත්ත ඇතුලත් වන ආකාරය පිළිබඳ ව පැමිණිල්ල සාක්ෂි මෙහෙයවන ලදින් ඇඳ ඉහපත පැ.02 ලෙස ලකුනු කිරිම ට අධිකරණය විසින් ඉඩ සලසා දී ඇත. සාක්ෂිකරු ගේ මුලික සාක්ෂිය අවසන් කිරීමෙන් අනතුරු ව, ඇඳ ඉහපතෙහි නීතිමය වලංගුතාවය පිළිබඳ ව අභියෝගය ට ලක් නොකරන බව ට 01, 02 චූදිතයන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා අධිකරණයට දන්වා ඇත.[5]

13 MAY 2019

---

[2] 316,326 වෙනි වගන්තියේ සලස්වා ඇති අවස්ථාවේදී හැර බරපතල තුවාල සිදු කරන තැනැත්තෙකුට අවුරුදු හත දක්වා කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරිමකින් දඬුවම් කල යුතුය. ඔහු දඩයකට ද යටත් විය යුතුය.

[3] 311. පහත දැක්වෙන තුවාල පමනක් බරපතල තුවාල ලෙස නම් කරනු ලැබේ.
(අ) අපෞරුෂායනය.
(ආ)දෙඇසින් එක් ඇසක පෙනීම සදහටම නැති කිරීම හෝ දුර්වල කිරීම.
(ඇ)දෙකනින් එක් කනක හෝ ඇසීම සදහටම නැති කිරිම හෝ දුර්වල කිරීම.
(ඈ)යම් අවයවයක හෝ සන්ධියක ක්‍රියාකාරිත්වය නැති කිරිම.
(ඉ)යම් අවයවයක හෝ සන්ධියක ශක්තිය විනාශ කිරීම හෝ සදහටම දුර්වල කිරීම.
(ඊ)හිස හෝ මුහුණ සදහටම විරූප කිරීම.
(උ)අස්ථියක් කිට්ලේජ හෝ දතක් කැපීම හෝ හංග කිරීම හෝ අස්ථියක් සන්ධියක් හෝ දතක් අවසන්ධි කිරිම.
(ඌ)ජීවිතයට අන්තරාකාරී වන යම් තුවාලයක් හෝ යම් තුවාලයක ප්‍රතිපලයක් වශයෙන් උරස්, උදර හෝ කපාල කුහර විවෘත කිරීමට සිදුවන ශල්‍ය කර්මයක් සිදු කරනු ලැබේ ද, එවැනි තුවාලයක් ,
(එ)යම් තුවාලයක් හේතු කොට ගෙන හෝ යම් තුවාලයක් නිසා කලයුතු වූ ශල්‍යකර්මයක් හේතුකොට ගෙන දින විස්සක කාලයක් තදබල ශාරීරික වේදනා විදීමට සිදු කැරෙන හෝ තමාගේ සාමාන්‍ය කටයුතු වල නිරත වීමට නොහැකි වන අන්දමේ යම් තුවාලයක්,

[4] 2015.03.18 පස්වරු 3.20 සිට පස්වරු 3.35 පිටුව 03

[5] 2015.04.28සටහන් අවසානය.

කෙසේ නමුත් මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්න සඳහා යොමු කිරීමේ දී , 03 වන වූදිත වෙනුවෙන් ද හරස් ප්‍රශ්න යොමු කර ඇත්තේ, 01,02 වූදිතයන් වෙනුවෙන් මුලින් පෙනී සිටි නීතීඥවරයා ම වේ. කෙසේ වෙතත් පැ. 02 ලේඛනය සලකුණු කර ඇත්තේ, අධිකරණයෙන් ම ලද අවසරය මතය.

පැමිණිල්ලේ එකොලොස්වන සාක්ෂිකරු රෝගියාව 2008.06.08 දින පරීක්ෂා කලබව පැ.01 අනුව සාක්ෂි ඉදිරිපත් කිරීමට යෙදුනි. හරස් ප්‍රශ්න විමසීමේ දී එදින පමණක් නොව, ඉන් අනතුරුව 2008.06.09 සහ 2008.06.26 දින ද, මෙම රෝගිය පරීක්ෂා කල බව ට සාක්ෂිකරු හෙලිදරව් කර ඇත. එසේ පරීක්ෂා කිරීමට හේතුව රෝගී තත්වය නිසා බව ද මෙම සාක්ෂිකරු ගේ ස්ථාවරයයි.

ඉදිරිපත් කල පැ.01 ලේඛනය සහ සාක්ෂි අනුව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු වූ තුවාලය ලෙස හඳුනාගෙන ඇත්තේ, තුවාල කෙක් පමණි. ඉන් පළමු තුවාලය බරපතල නොවන වම් කලවයේ පිටුපස වූ සීරීම් තුවාල යකි. දෙවන තුවාලය බරපතල තුවාලයක් ලෙස සැලකිය හැකි වම් ඇසේ වූ තුවාලයක් වන අතර, මෙම තුවාලය ඇසෙහි බෝලය පුපුරා යැමෙන් සම්පූර්ණයෙන් ම ඇස අන්ධ වන තුවාලයක් බව ට සාක්ෂිකරු සනාථ කර ඇත. පනතේ 311 වගන්තිය යටතේ (ආ) සහ (ඉ) යටතට මෙම තුවාල වැටෙන බවත්, මෙම සාක්ෂිකරු තහවුරු කර ඇත. පැ.01, 1වි 23 යන ලේඛන සහ තුවාල සම්බන්ධ ව විවෘත අධිකරණයේ ලබා දුන් සාක්ෂි ප්‍රකාරව, පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ට සිදු වී ඇති තුවාල හා සම්බන්ධ ව ඒවා සනාථ කිරීම ට අදාල සාක්ෂි පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇති බව ට අධිකරණ ට සෑහීමට පත්විය හැකි ය.

රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය හා සම්බන්ධ කාරණාව වූදිතයන් වෙනුවෙන් හබ කර සිටි. පැ.01 ලේඛනය ප්‍රකාර ව, රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය පැමිණිල්ලේ එකොලොස්වන සාක්ෂිකරු මෙසේ පැහැදිලි කරයි.[6]

ප්‍ර: ඔහුට ඇතිවෙච්ච තුවාල තත්වය ඇතිවුනේ කොහොමද කියලා ඔබ ට කිව්වාද?

උ: ඔහු මට කිව්වා. මට 2008.06.07 වන දින රාත්‍රී 09.00 ට පමන කහව ස්ටේෂම පිටිපස්සේ එස්.අයි අතුකෝරලයි තවත් හතර දෙනෙකුයි මට අතිනුයි, පයිනුයි ගැහුවා. මම වැටුනා. ඊට පස්සේ මාව එක්කගෙන ඇවිත් ජීප් එකට දාගත්තා. මම ජීප් එකෙන් බහින්න හදනකොට එස්.අයි. අතුකෝරල මට තුවක්කුවේ මීටෙන් ගැහුවා. මගේ වම් ඇහැට තමයි වැදුනේ. දෙපාරක් ගැහුවා. පළවෙනි එක බෙල්ල ට වැදුනා. දෙවෙනි පාර තමයි ඇහැ ට වැදුනේ. ඊට පස්සේ මාව ඇල්පිටියේ රෝහල ට එක්ක ගියා. එතනින් කරාපිටිය ට එව්වා.

ප්‍ර: දැන් මහත්මයා ඒක මහත්මයාගේ වාර්තාවේ සඳහන් කලාද?

උ: ඔව් ස්වාමීනී.

පැ.01 හි එසේ වාර්තා කර ඇති කොටස මෙසේ ය.

---

[6] 2015.04.28 සාක්ෂි සටහන් 06, 07 පිටු

13 MAY 2019

*"On 07/06/2008 around 9.00p.m. behind kahava station. He was assaulted by "S.I. Athukorala" and few other police officers using hand and feet over his body. He has fallen down ones. Then he was put inside a police jeep. When he was trying to get down from the police jeep. "S. I. Athukorala" hit over his face using the but of a gun' He received an injury to his left eye' then he was taken to Balapitiya hospital. He was transferred to teaching hospital. Karapitiya"*

1.වි.23 ලේඛණය සලකුණු කරන ලද්දේ එහි රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය මෙන් ම තුවාල පිළිබඳවද, ඇති අඩුපාඩුව අධිකරණය ට හෙළිදරව් කිරීම ටය. 1වි.23 ලේඛණයේ රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය මෙසේ සඳහන්ය.

*"Allegedly assaulted by a police officer on 07/06/2008 around 9.00 pm using an iron bar over left eye no loss of consciousness present"*

පැ.01 හි සහ 1.වි.23 යන ලේඛනයේ මෙම කෙටි ඉතිහාසය දැක්වෙන කොටසේ වෙනස සම්බන්ධව මූලික ව ම සඳහන් කරන ලද්දේ, එම ස්ථානය අතින් ලිවීම ට සිදු වූ බවත්, ඉඩ මදිකම හේතුවෙන් කෙටියෙන් ලියන ලද බවත් ය. මෙහි දී ඇඳ ඉහපතේ දැක්වෙන පරිදි යකඩ පොල්ලෙන් පහර දීම සඳහන් කල බවත්, රෝගියා විසින් ලබා දුන් කෙටි ඉතිහාසය තමා විසින් පවත්වා ගෙන යන ලද පොතක ද, සටහන් කර ගන්නා ලද බවත්, පැ.01 ලේඛනයේ අඩුපාඩු පිළිබඳ ව තමා වෙත දැනුම් දීමෙන් අනතුරු ව පැ.01 දරණ ලේඛනය සකස් කිරීම ට හේතු වූ බව සාක්ෂිකරු ගේ ස්ථාවරය යි. ලකුණු කරන ලද පැ.02 ලේඛණය අනුව එහි පස්වන පිටුවේ පසු පිටෙහි මෙම පහර දිම පිළිබඳ ව සඳහන් ය. එහි දැක්වෙන පරිදි යකඩයකින් වූ පහර දීමක් ලෙසද, එය පොලීසිය විසින් එදින රාත්‍රී 09.30 ට පමණ සිදුකල පහර දීමක් බව ට ද දක්වා ඇත. එසේ ඇඳ ඉහපත් ලේඛනය ප්‍රකාර ව යකඩයකින් පහර දුන් බව ට සඳහන් කල බව සාක්ෂිකරු ප්‍රකාශ කල ද, තම සටහන පරිදි පැ. 01 ලේඛනයේ තුවක්කු බඳකින් පහර දුන් බව ට එසේ ඇතුලත් කල ද සාක්ෂිකරු ප්‍රකාශ කල සටහන් පොත අනුසාරයෙන් ප්‍රශ්න කිරීමේ දී මෙම සාක්ෂිකරු පිලිගෙන ඇත්තේ තමා සටහන් කර ගන්නා ලද පොතේ ද සඳහන් වන්නේ යකඩ පොල්ලකින් පහර දුන් ලෙසට කියා ය. ඒ අනුව මෙම වෙනස පිළිබඳව ප්‍රශ්න කිරීමේ දී 1.වි.23 ලේඛනයේ රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසය සහ පැ.01 ලේඛනයේ එම කොටසෙහි වෙනස පිළිබඳව පැහැදිලි කිරීම ට සාක්ෂිකරු අපොහොසත් විය. ලේඛනයේ ඉඩ ප්‍රමාණය හේතුවෙන් එසේ සඳහන් කල බව ට ඉදිරිපත් කල කරුණ සාධාරණීකරණය නොවූ බව ඉහත කරුණු මත අධිකරණයේ මතයයි. රෝගියෙකු විසින් ලබා දෙන කෙටි ඉතිහාසය වෛද්‍ය වාර්තාව සටහන් කිරීමේ දී ඇති වෙනස්කම එකී වෙනස්කම නිසා පමණක් වෛද්‍ය සාක්ෂි බැහැර කිරීම ට හෝ පැමිණිල්ලේ නඩුව කෙරෙහි සාධාරණ සැකයක් ජනිත කිරීම ට හේතුවන්නේ නැත. මෙම කෙටි ඉතිහාසයේ දැක්වෙන වෙනස පිළිබඳව නඩුවේ සමස්ත සාක්ෂිය විශ්ලේෂණය කිරීමේ දී පැමිණිල්ලේ නඩුව කෙරෙහි කෙසේ බලපාන්නේ ද යන්න විමසා බැලිය යුතුය. සිද්ධිය පිළිබඳව ඉදිරිපත් කරන සාක්ෂි සාධාරණ සැකයෙන් තොරව ඉදිරිපත් කර සනාථ කර ඇත්නම් එහි දී ඇඳ ඉහපතෙහි සඳහන් ප්‍රකාශය මෙන් ම වෛද්‍යවරයා විසින් ඔහු සතු

13 MAY 2019

ලේඛණයන්හි සඳහන් නොවූ කාරණාවක් එම ලේඛණයන් ට ඇතුලත් කර තිබීම පැමිණිල්ලේ නඩුවේ ඔප්පු කිරිමේ බාරය කෙරෙහි ප්‍රබල අභියෝගයක් එල්ල කරයි.

තුවාලකරු ගේ වම් ඇස තුවාල වී ඇති ආකාරය පිළිබඳ වෛද්‍ය මතය පිළිබඳ ව, පාර්ශවකරුවන් වෙනුවෙන් විමසා සිටින ලදි. තුවක්කු බඳකින් තුවාලය සිදුවිය හැකි ආකාරය හා සම්බන්ධ ව, පැමිණිල්ලේ එකොලොස්වන සාක්ෂිකරු රූප සටහනක් පවා අඳින ලද අතර, එකී සටහන x ලෙස ලකුණු කිරීම ට ද යෙදුනි. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ ස්ථාවරය වන්නේ තමාට වූ තුවාලය තුවක්කුවේ පිටුපස කොටසින් සිදු වූ තුවාලයක් බව යි. පොලිස් නිලධාරීන් භාවිතා කරන ටී 56 තුවක්කුවක පිටුපස යකඩයෙන් සාදා ඇති උරහිසට හේත්තු කිරීමට ඇති රඳවනයෙන් පහරක් වැදුණේ නම් ඇහේ බෝලය පමණක් බාහිර තුවාල නොමැතිව හානි වීමේ හැකියාවක් නැත. එහෙත් එකී කොටස නමා තිබූ අවස්ථාවක ලී මිට සහිත කොටස යම් හෙයකින් වැදුනේ නම් එහි ස්වභාවය අනුව බාහිර තුවාලයහකින් තොරව ඇස තුල පමණක් තුවාල වීමේ ඉඩ කඩ ඇත. එහෙත් කරුණේ වාසිය පැමිණිල්ලට ලැබෙන්නේ තුවාලකරුට තුවාල සිදුවීම හා සම්බන්ධයෙන් චූදිතයන්ගේ සම්බන්ධතාවය සනාථ කළහොත් පමණි.

වෛද්‍යවරයා ගේ මතය වන්නේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ට වූ තුවාල ඇද වැටීමකින් සිදුවිය හැකි තුවාල නොවන බව යි. ඇද වැටීමක් සිදුවූයේ නම් වැටීම හා සම්බන්ධ තුවාල තිබිය යුතු අතර, තුවාලකරු ට වී ඇති එකම තුවාලය ඔහුගේ වම් ඇස ආශ්‍රිත සිදුවූ තුවාලය සහ වම් කලවයේ පිටුපස ඇති සීරීම් තුවාලය පමණක් බය ය. එසේ ම ඇද වැටීමක් වූයේ නම් ඇහේ බෝලය ඉලක්ක කර ගෙන යමක් වැදිය යුතු බවත්, වෛද්‍යවරයාගේ ස්ථාවරය යි. රෝගියා විසින් ලබා දුන් කෙටි ඉතිහාසයේ ප්‍රකාශ කර ඇති පරිදි පළමු පහර බෙල්ල ට වැදුනු බව ට කියා සිටියද, බෙල්ල ට සිදු වූ තුවාල හා සම්බන්ධ ව කිසිදු සඳහනක් වෛද්‍ය වාර්ථාවේ නැත. පහර දීමකින් එකී තුවාල සිදුවීම ට නම් පහර දුන් ආයුධය තුනී ආකාරයේ ආයුධයක් විය යුතු බවත්, එය ද ඇහේ මැද ම ඉලක්ක කර ගෙන වැදිය යුතු බවත්, තුවක්කු බඳක උල් කොටස එසේ වැදීම මගින් තුවාලය සිදුවිය හැකි බවත්, වෛද්‍යවරයා ගේ ස්ථාවරය යි. තුවාල වූ ඇස වටා වෙනත් තුවාල නොමැති කාරණය කෙරෙහි වෛද්‍යවරයා ගේ අවධානය ට යොමු කරන ලද අතර, වෛද්‍යවරයා ගේ නිරීක්ෂණ අනුව ඇස වටා වෙනත් කිසිදු තුවාලයක් තිබී නැත. එසේ තුවාලයක් ඇති විය හැකි පරිදි විශාල දෙයක ඇස ගැටුනේ නම් එහි බලය හිස් කබල අවශෝෂනය කර ගන්නා අතර, එමගින් ඇස ට වන හානිය වැලකෙන බව ද වෛද්‍යවරයා ගේ මතය යි. තවද පහර දීමේ දී ඒ අනුව පැතලි පැත්තෙන් පහර වැදුනේ නම් වම් ිඇසේ තුවාලය සිදුවිය නොහැක්කක් බව වෛද්‍යවරයා ප්‍රකාශ කර ඇත.

වම් කලවය පිටුපස ඇති තුවාලය සිදුවිය හැකි ආකාරය, පහරදීමක ට වඩා වැටීමකින් සිදුවිය හැකි බව ද වෛද්‍යවරයා ප්‍රකාශ කර ඇත.

පැ.1 ලේඛණය පරිදි රෝගියාව 2008.06.08 දින අධිකරණ වෛද්‍ය නිලධාරීවරයා පරීක්ෂා කර ඇත. 1වී23 ලේඛණයේ ද සඳහන් වන්නේ එම දිනය යි. ඉන් අනතුරුව 2008.06.09 සහ 2008.06.26 වන දිනද රෝගියා පරීක්ෂා කල බවත්, එසේ පරීක්ෂා කරන ලද්දේ රෝගී තත්වය උස්සන්න වීමට ඇති ඉඩ ප්‍රස්ථාව හේතුවෙන් බව ත් වෛද්‍යවරයා ප්‍රකාශ කල අතර ඉන් අනතුරුව

13 MAY 2019

රෝගියා හමුනොවූ බව ඔහුගේ ස්ථාවරය යි. පැ.1 ලේඛණයේ හැර ඇඳ ඉහ පතේ ද 1 වි23 ලේඛණයේ ද, වෛද්‍යවරයා සටහන් කර ගත් බව කියන A4 කොළයේ ද, ඔහු සටහන් කර ගත් පොතේ ද සඳහන් ව ඇති බව ට හෙලිවන්නේ තුවාලකරු දැනුම් දී ඇත්තේ යකඩ පොල්ලකින් පහරදීමක් හා සම්බන්ධ ව බව යි. එහෙත් එම කරුණු පැ.1 ලේඛණ ය ට ඇතුලත් කිරීමෙ දී පහරදීම අතුකොරල යන නිලධාරියා තුවක්කු බඳෙන් පහර දීම දක්වා වෙනස් වූ ආකාරය පැහැදිලි කිරීම ට වෛද්‍යවරයා සමත් වූයේ නැත. මෙය පැමිණිල්ලේ සාක්ෂියේ ඇති විශ්වසනීයත්වය පලුදු කිරිම ට ද හේතුවක් වේ.

ඉහත කරුණු අනුව තුවාලකරු විසින් තුවාල සිදු වූ ආකාරය පිලිබඳ වෛද්‍යවරුන් වෙත දන්වා සිටීමේ දී මුලින් ම දන්වා ඇත්තේ, යකඩ පොල්ලකින් තමා ට පහර දීම මගින් තුවාල සිදු වූ ලෙසට ය. පැ.01 අනුව ඒ 2008.06.08 දින ය. පැ.02 ලේඛණය අනුව ද එසේ දන්වා ඇති දිනය 2008.06.08 දිනය ම වේ. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගේ සාක්ෂි අනුව ඔහු ට තුවාල සිදුවීම පිළිබඳ ව සැකයක් නැත. එහෙත් තුවාල සිදු වූ ආකාරය පිළිබඳ ව සාක්ෂිකරු ප්‍රකාශ කර ඇති කරුණු වෛද්‍ය වාර්තා අනුව පරස්පර ය.

පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ සාක්ෂි අනුව පහරදීම හා සම්බන්ධ සිද්ධිය 07.06.2007දින සිදු ව ඇත. එය එසේ සටහන් ව තිබුණ ද පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු යම් වරදක් සඳහා සැකපිට අත්අඩංගුව ට ගත් අයෙකු වේ. ඒ අනුව මෙම සිදුවීම 2008 වර්ෂයේ සිදුව ඇති බව ට පැහැදිලි ය. පසුදින තමා ට රැකියාව ට ද යාම ට ඇති බැවින් පොඩි චමීර යන අය හමු වී බැගයක් ලබා ගැනීම ට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු පොඩි චමීර යන අයගේ නිවස ට ගොස් ඇත. පොඩි චමීර යන අය නිවසේ නොසිටි අතර ඔහු සෙල්ලම් කිරීම සඳහා ගොස් ඇති බව ට නිවැසියන් ගෙන් දැන ගැනීම හේතුවෙන් තමා ගෙවල් 20 ප්‍රදේශය ට යන ලද බව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගේ ස්ථාවරය යි. ගෙවල් 20 ප්‍රදේශය ට යන ලද්දේ පොඩි චමීර සහ අනිත් යහළුවන් එම ප්‍රදේශයේ ක්‍රීඩා කරන නිසා බව සාක්ෂිකරු ප්‍රකාශ කරයි. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගේ පවුල ට අයත් දේපලක් ද එම ස්ථානයේ ඇති බව ත්, සුනාමි ව්‍යසනය නිසා ඔවුන් එසේ පදිංචි වී නිවස කඩා යාම හේතුවෙන් එම ස්ථානය හිස් ඉ ඩමක් ලෙස පවතින අතර එය ක්‍රීඩා කිරීම සඳහා ඔවුන් යොදා ගන්නා බව ට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කරන ලදි. සෙල්ලම් කරන ස්ථානයට යන අවස්ථාවේ දී යහළුවන් සෙල්ලම් කරමින් සිටි අතර තමා සෙල්ලම් නොකර චමීර එනතුරු එම ස්ථානයේ රැඳී සිටි අතර පිරිසක් ක්‍රිකට් ක්‍රීඩා කල අතර තව පිරිසක් මත්පැන් පානය කරමින් සිටි බව ත්, රෑ බෝවෙන විට ක්‍රිකට් ක්‍රීඩා කල අය ද, මත්පැන් පානය කල අය ට එකතු වූ බව මෙම සාක්ෂිකරු කියා සිටී. ඔහු එම ස්ථානයේ සිටියද, තමන් මත්පැන් පානය නොකල බව මෙම සාක්ෂිකරු 2014.02.05 දින සාක්ෂි දීමේදී කියා ඇත. රාත්‍රී 6.45 ට පමණ චමීර යන අය පැමිණි අතර, ඔහු සමග රැකියාව ගැන කතා කරන ලද බව ත්, ඒ අවස්ථාවේ දී තමන් දූරකථනය කින් කතා කර කර සිටි අතර එහි දී මත්පැන් පානය කල පිරිස සිටි ස්ථානයෙන් මඳක් ඉවත් වූ බව ත්, පසුව තමා වත්තේ කණුවක වාඩි වී සිටි අතර, එම අවස්ථාවේ දී රතිඤ්ඤා පත්තුවෙන ශබ්දයක් වැනි ශබ්දයක්, එනම් ශබ්ද තුනක් ඇසුන අතර, එකී ශබ්දය කහව දුම්රිය ස්ථානය දෙසින් ඇසුන බව ත්, මඳ වේලාවකින් හතර දෙනෙකු තමන් සිටි දෙස ට පැමිණි අතර, දුම්රිය ස්ථානයේ ලයිට් එළියෙන් හතර දෙනෙකු එන බව ට හඳුනා ගත් අතර, ඔවුන් අත තුවක්කුවක් ද තිබූ බව ත්, තවත් අයෙකු ගේ අතේ පොල්ලක් තිබූ බව ත් ය. ඔවුන් සාමාන්‍ය ගමනින් පැමිණි අතර, පැමිණෙන්නේ පොලිසියෙන්

13 MAY 2019

බව ට හඳුනා ගැනීමෙන් අනතුරුව අන් සියළු දෙනා පැන දිවූ බව ත්, තමා වරදක් නොකළ හේතුවෙන් එම ස්ථානයේ ම රැඳී සිටි බව ත්, පැමිණි අය ගෙන් දෙදෙනෙක් තමා දෙස ට පැමිණි බවත්, එක් අයෙකු අත තුවක්කුවක් සහ අනෙක් අය අත පොල්ලක් තිබූ අතර, ඔවුන් තමා ව අල්ලා ගත් බව ත්, ඒ සඳහා තමන් අවනත නොවූ හේතුවෙන් තමා ව අල්ලා ගෙන ජීප් රථය ලඟ ට රැගෙන ගොස් පිටුපස දොරෙන් නන්වා ගන්නා ලද අතර, තමන් වරදක් නොකල හේතුව මත පැමිණි අය ට අවනත නොවී දිගින් දිගට ම ආරවුල් කර ගත් බව මෙම සාක්ෂිකරු ප්‍රකාශ කරයි. ජීප් රථය ට නන්වා ගන්නා ලද්දේ ද කොලරයෙන් අල්ලා මැරුම් නොකා නගින ලෙස ට දැන්වීම මත බවත්, පොල්ල අතේ තියා ගෙන සිටි පුද්ගලයා එසේ තමාට තර්ජනය කල අය බව ත්, පසුව ජීප් රථය ට පිටුපසින් තව තිදෙනෙකු ගොඩ වූ අතර, තුවක්කුව අතේ තබාගෙන සිටි පුද්ගලයා තමාගේ වම් පසින් ද, අනිත් දෙදෙනා ඉ දිරි පසින් ද වාඩි වූ බව ට මෙම සාක්ෂිකරු කියා සිටී.තමා ව එසේ රඳවා ගැනීම ට හේතුවක් නොකී අතර, තමා ඔවුන් ගෙන් මිදී යාම ට උත්සාහ කල බවත්, පොල්ල අතේ තියාගෙන සිටි පුද්ගලයා තමාගේ කම්මුලට පහර දුන් අතර, තවදුරටත් භය වී තමා ඔවුන් ගෙන් මිදී යාම ට උත්සාහ කිරීමේ දී, තමා ව පිටු පසින් ඇද වාඩිකර ගන්නා ලද බව ත්, තමා වැඩිදුරටත් දැඟලීමේ දී තමා ට පරුෂ වචනයෙන් පවා බැන වැදුන අතර, තමා නැවතත් පැනීම ට තැත් කිරීමේ දී ඉහවට අත යවා ඉන්දවා ගන්නා ලද බව ත්, ඒ වම් පස සිටි අය බවත්, ඉ න් අනතුරුව තමාට කුණුහරුපයෙන් බැන බෙල්ල ප්‍රදේශය ට පහරක් ගසන ලද අතර, තමා ගේ කැගැහිල්ල සහ දැඟලීම වැඩිවීම හේතුවෙන් වාඩිකර ඇහැට පහර දුන් බව ට ප්‍රකාශ කරයි. ඉන් තමාගේ මුහුණ ට සහ ඇහැ ට ලොකු පහරක් වැදුන අතර, තමා මුහුණ අල්ලා ගන්නා ලද බවත්, එම පහර වම් පැත්තේ කෙනා ගෙන් පැමිනි පහරක් වන අතර, එහි දී ඉදිරියේ සිටි අයගෙන් අතුකෝරල යන නම ප්‍රකාශ කර ඇහැට වැදුන බව ට ප්‍රකාශ කරන ලද බව ත්, ඒ වන විටත් වාහනය දුම්රිය පොල අසල නතර කර තිබූ අතර තමා වේදනාව නිසා ඔළුව ගසාගෙන සිටිය දී ජීප් රථය ගමන් කල අතර ජීප් රථය දුම්රිය හරස් මඟ අසල නවත්වා තිබිය දී රසංග යන අය දැකීම හේතුවෙන් තමා ඔහුට බේරා ගැනීම ට දැනුම් දුන් බවත්, මෙම සාක්ෂිකරු ප්‍රකාශ කරයි. මෙම පහරදීම සිදුවීම ට පෙර තම ඇසේ කිසිදු දෝෂයක් නොතිබූ අතර, මෙම පහර දීම මගින් ඇහේ පෙනීම නැති වූ බව සාක්ෂිකරු ගේ ස්ථාවරය යි.

පැමිණිල්ලේ පළමු මෙන් ම පස්ව සාක්ෂිකරු ද ප්‍රකාශ කරන්නේ තුවාලකරු ව කැබ් රථයක එනම් පොලීසියේ ඇති ටාටා වර්ගයේ වැනි කැබ් රථයක ගෙන යන ලද බව යි. එය පිටුපස පේලි දෙකට ආසන මුහුණෙන් මුහුණ ලා දික් අතට පිහිටා ඇති පිටුපස පහල කොට ස ට පමණක් දොරක් ඇති වාහනයක් බව සාක්ෂිකරුවන් ගේ ස්ථාවරය යි. පැමිණිල්ල වෙනුවෙන් පැමිණිල්ලේ සාක්ෂි අංක 09 ලෙස කැඳවන ලද විශ්‍රාම ලත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පින්තේරු මහවඩුගේ අර්ඩ්ලි කැමිලස් ප්‍රනාන්දු යන අයගේ සාක්ෂි අනුව ඔහු අධි චෝදනාවට අදාල කාලයේ කරන්දෙණිය පොලිස් ස්ථානයේ ද අධීක්ෂණය කල නිලධාරියෙකි. එසේම මෙම සිද්ධිය හා සම්බන්ධයෙන් පැමිණිල්ලේ දෙවන සාක්ෂිකාරිය විසින් කල පැමිණිල්ලේ විමර්ශන නිලධාරියා ද වේ. මෙම චූදිතයන් මෙම අධිකරණයට ඉදිරිපත් කර ඇත්තේ ඔහුගේ විමර්ශනයන් හි ප්‍රථිඵලයක් ලෙසට ය. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ දී හෙලිදරවු වූ පරිදි තුන්වන චූදිත ඇතුළු කණ්ඩායම වැටලීම සඳහා පිටවීමේ දී සටහන් යොදා ඇත්තේ ත්‍රීරෝද රථයකින් බව ට ඔහු හෙලිදරවු කරන ලදි. නමුත් පොලිස් ස්ථානයේ ත්‍රීරෝද රථයක් නොතිබූ බවට මොහු හෙලිදරවු කල අතර මිටියාගොඩ පොලිස් ස්ථානයේ එවක ට තිබූ වාහන පිළිබඳ පැහැදිලි කිරීම ට ඔහු අසමත් විය. එසේ තිබිය දී මෙම

13 MAY 2019

වැටලීම සඳහා පැමිණිල්ලේ සාක්ෂිකරුවන් ප්‍රකාශ කල පරිදි ජීප් රථයක් හෝ කැබ් රථයක් භාවිතා කලේ නම් ඒ බව සනාථ කිරීමේ භාරයක් පැමිණිල්ලට ඇතත් පැමිණිල්ල එකී කරුණ සනාථ කර නැත. පැමිණිල්ල විසින් ම ඉදිරිපත් කල සාක්ෂි අනුව තුන්වන චූදිත ඇතුළු කණ්ඩායම වැටලීම සඳහා පිටව ඇත්තේ ත්‍රීරෝද රථයකිනි.

මෙම නඩුවේ පළමු චූදිත ගේ ස්ථාවරය වන්නේ තමා කිසිදු අවස්ථාවක පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු අත්අඩංගුව ට ගැනීම සඳහා වූ වැටලීම ට සහභාගී නොවූ බව යි. විත්ති වාචක කැඳවීමේදී ද ඔහු ගේ ස්ථාවරය වූයේ තමා එදින පොලිස් ස්ථානයේ රාජකාරියේ රැඳී සිටියා මිස බාහිර රාජකාරිය සඳහා සහභාගී නොවූ බව යි.

පැමිණිල්ල වෙනුවෙන් ම කැඳවන ලද පැමිණිල්ලේ 08 වන සාක්ෂිකරු එදින උපසේවය භාරව සිටි නිලධාරියා වන අතර පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු අත්ඩංගුව ට ගැනීම ට යෙදුනු වැටලීම සඳහා පිටවුන නිලධාරින් අතර පළමු චූදිත නොසිටි බවත්, මෙම සාක්ෂිකරු ගේ ස්ථාවරය යි. තුවක්කුව පවා රැගෙන යන ලද්දේ කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වූ තුන්වන චූදිත බව ලේඛන අනුව මෙම සාක්ෂිකරු ප්‍රකාශ කිරීම ට යෙදුනි.

පැමිණිල්ලේ අටවන සාක්ෂිකරු ලෙස කැඳවන ලද්දේ පොලිස් කොස්තාපල් 45430 ගෝනපීනුවල විතානගේ සුජිත් වන අතර, එම සාක්ෂිකරු මෙම නඩුව ට විෂයගත කාල සීමාවේ උප සේවා රාජකාරිය භාර ව සිටි නාලධාරිවරයෙක් වේ. එම සාක්ෂිකරු මෙම නඩුවේ 01,02,03 චූදිතයින් සැකකරුවන් භාර ගැනීම ඔවුන් ගේ නිරික්ෂණ සටහන් කිරීම ආදිය සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු සාක්ෂි ඉදිරිපත් කරන ලදි.

පැ.03(සී) දරණ ලේඛනය, මෙම සාක්ෂිකරු හඳුනා ගත් ලේඛනයක් වූ අතර පැ.03(සී) ලේඛණයේ 2008.06.07 පැය 21.30 පිටුව 278, ඡේදය 52 යටතේ ඇති සටහන් මෙම සාක්ෂිකරු හඳුනා ගන්නා ලදි. මෙහි දී සැකකරුවෙකු ලෙස මෙම නඩුවේ පළමු සාක්ෂිකරු භාර ගත් කාරණාව මෙම සාක්ෂිකරු හෙළිදරව් කර ඇත. එසේ භාර ගැනීමේ දි ද මෙම සාක්ෂිකරු ගේ වම් ඇස ආබාධයකට ලක් ව තිබූ කාරණාව ද , මෙම සාක්ෂිකරු හෙළිදරව් කරන ලදි. ඔහු ට වෛද්‍ය ප්‍රතිකාර නොකිරීම පිළිබඳ ව අසන ලද පැනයන් සඳහා පිළිතුරු දෙමින් මෙම සාක්ෂිකරු හෙළිදරව් කරන ලද්දේ මෙම තුවාල සම්බන්ධයෙන් විනාඩි 20 ක පමණ කාලයක් තුල ස්ථානාධිපතිවරයා ට දැනුම් දී ප්‍රතිකාර ලබා දීම ට සැලැස් වූ බව යි. එකී සැකකරු ලෙස හඳුන්වන මෙම නඩුවේ පළමු සාක්ෂිකරු ගේ තුවාල පරීක්ෂා කිරීම පිළිබඳ ව, ප්‍රශ්න කිරීමේ දී හෙළිදරව් කිරීම ට යෙදුනේ තමා මෙම අයගේ තුවාල පරීක්ෂා කරන ලද බවත්, ඔහු වෙනත් තුවාල නිරීක්ෂණය නොකරන ලද බවත් ය. උපසේවය ට සැකකරුවෙකු භාර ගැනීමේදී, අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු පරීක්ෂා කරන ආකාරය ට තුවාල පරීක්ෂා කිරීම සඳහා අවකාශයක් හෝ හැකියාවක් ලැබෙන්නේ යැයි විශ්වාස කල නොහැකිය.

අවි භාරදීම පිළිබඳ ව සටහන් හා සම්බන්ධයෙන් ද මෙම සාක්ෂිකරු සාක්ෂි ඉදිරිපත් කරන ලදි. මෙම නඩුවේ 03 වන චූදිත ටී. 56 ගිනි අවියක් සහ එම උණ්ඩ 30 ක් රැගෙන ගිය බව ට හෙළිදරව් කරන ලද අතර, පැ.03(ඊ) සටහන් ප්‍රකාර ව, 03 වන චූදිත රැගෙන ගිය ගිනි අවිය සහ

13 MAY 2019

උණ්ඩ නැවත භාර දීම පිළිබඳ සටහන් සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් කරන ලදි. ඉන්දික යන නිලධාරියා ගේ අත්සනින් සහ අත් අකුරින් ඔහු ගේ සටහන් මෙම සාක්ෂිකරු හඳුනා ගන්නා ලද බව ට හෙළිදරව් කරන ලද අතර මෙම සාක්ෂිකරු ඉහත කී නිලධාරියා සමග සේවය කල නිලධාරියෙකු බව ට ද හෙළිදරව් විය. මෙම සාක්ෂිකරුගෙන් හෙළිදරව් වූ තවත් කරුණක් වූයේ තමා ගේ භාරයෙන් රැගෙන ගිය ටී. 56 ගිනි අවිය මෙන් ම උණ්ඩ 30 ක ප්‍රමාණය ද 03 වන චූදිත උප සේවය ට නැවත භාර දුන් කාරණාව යි. එය ගණන් කර ආපසු බාර ගැනීම පිළබඳව ද මෙම සාක්ෂිකරු හෙළිදරව් කරන ලදි.

පොලිස් ස්ථානය ට ලැබුණු නිර්නාමික දුරකථන ඇමතුමක් මත දෙපිරිසක් අතර යම් ගැටුමක් ඇතිවීම ට ඉඩ ඇති බව ට වූ දැනුම් දීමක් මත නිලධාරීන් එම ප්‍රදේශය ට පිට ව ගිය බවත්, එසේ පිට ව යන ලද්දේ 03 වන චූදිත ඇතුළු කණ්ඩායම බවත්, කණ්ඩායම භාර ව යන ලද්දේ 03 වන චූදිත බවත් මෙම සාක්ෂිකරු ගේ ස්ථාවරය යි. සාක්ෂිකරුගෙන් වැඩි දුරටත් ප්‍රශ්න කිරීමේ දී හෙළිදරව් කිරීම ට යෙදුනේ. මෙම කණ්ඩායම ට පළමු චූදිත ඇතුලත් නොවුන අතර, රාජකාරිය සඳහා පිට වූ කණ්ඩායම සමග පළමු චූදිත ද ගිය බව ට තමා නිරික්ෂණය නොකල බවයි. යම් වැටලීමක් සඳහා පිටවීමේ දී එහි පැමිණීමේ සහ පිටවීමේ සටහන් යොදන්නේ ද අවි සම්බන්ධ ව සටහන් යොදන්නේ ද කණ්ඩායම් නායකයා බවත් මෙම සිදුවීමේ දී අවිය රැගෙන ගිය නිලධාරියා භාන්ඩ නැවත භාරදීම පිළිබඳ ව සටහන් යෙදූ බව ද මෙම සාක්ෂිකරු 03 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසීමේ දී හෙළිදරව් කරන ලදි.

පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු පැමිණිල්ල විසින් සාක්ෂිය ට කැඳවන් ලද්දේ, පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගේ සාක්ෂියේ කොටසක් තහවුරු කිරීම ට ය.මෙම සාක්ෂිකරු ගේ සාක්ෂිය වන්නේ තමා 2008.06.08 දින රාත්‍රී කාලයේ කහව දුම්රිය පල අසල ඇති දුම්රිය හරස් මග ආසන්නයේ වූ කඩය ක කොත්තු රොටී මිල දී ගැනීම ට පැමිණි අතර එම ස්ථානය ට පොලිස් කැබ් රථයක් පැමිණ නැවැත් වීමෙන් අනතුරු ව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු එය තුල සිට තමා ට බේරාගන්නා ලෙස ආයාචනය කල බව යි. තමා පැමිනිල්ලේ පළමු සාක්ෂිකරු දක්නා ලද්දේ, ඔහු තමා ට කථා කල නිසා බවත්, තම අවධානය කෙළින් ම යොමු වූයේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු දෙස ට බවත්, මෙම සාක්සිකරු ප්‍රකාශ කර ඇත. ජීප් රථය තුල තවත් අය සිටි බවත්, එසේ ඔවුන් කෙරෙහි අවධානයක් යොමු නොවීම හේතුවෙන් ඔවුන් හඳුනා ගැනීමට නොහැකි වූ බවත් පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ප්‍රකාශ කරයි. නමුත් එක් අයෙකු පොලිස් නිලධාරින් අඳින කලිසමක් ඇඳ සිටි බැවින් ජීප් රථයේ පොලිස් නිලධාරීන් සිටි බව ට හඳුනා ගත් බව පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ගේ ස්ථාවරයයි.

කඩය අසල නවත්වන ලද ජීප් රථය ඉතා සුළු වේලාවකින් පිටත් වූ අතර, එකී කාලය පැහැදිලි කරන ලද්දේ, විනාඩි දෙක තුනකින් පමණ පිටත් වූ බව යි. තමා හට මත ඇත්තේ එකී කාලය තුල දුටු කරුණු පමණක් බවත් පැමිණිල්ලේ පස්වන සාක්සිකරු ප්‍රකාශ කරයි. එසේ ම මෙම සාක්ෂිකරු ජීප් රථය ලෙසට හඳුන්වන්නේ පොලීසියේ ඇති ටාටා වර්ගයේ කැබ් රථය බව ද මෙම සාක්ෂිකරු ගේ මස්ථාවරය යි. එකී හඳුන්වා දීම මත පැහැදිලි වන්නේ මෙම සාක්ෂිකරු අදහස් කරන්නේ සාම්ප්‍රදායික ලෙස පොලිස් ජීප් රථය ලෙස හඳුන්වන වාහනයක් නොව පිටුපස

13 MAY 2019

කොටසේ මුහුණ ට මුහුණලා දෙපස ට සිටි පේලි දෙකක්සවිකර ඇති වර්ගයේ වාහනයක් බව පැහැදිලි වේ.

පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු තමා කලක සිට හඳුනන තම ගමේ පදිංචි අයෙකු බවත්, කඩයේ තිබූ විදුලි ආලෝකයෙන් තමා පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු හඳුනා ගත් බවත් මෙම සාක්ෂිකරු ගේ ස්ථාවරය යි. සිටි පුද්ගලයින් අතරින් එක් අයෙකු නිල ඇඳුම ඇඳ සිටි අතර, ජීප් රථය නැවැත් වූ පසු ව එක් පුද්ගලයෙකු ඉහත කී කඩයෙන් බීම බෝතලයක් රැගෙන ජීප් රථයට නගින ලද බවත්, ඔහු කහපාට කලිසමක් ඇඳ සිටි බවත්, පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ප්‍රකාශ කරයි.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව ම, ඔහු පොලිස් ජීප් රථය ලෙස හඳුන්වන වාහනය හා කැබ් රථය ක වෙනස දන්නා බව පැහැදිලිය. එහෙත් පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු පොලිස් ස්ථානයට කල ප්‍රකාශයේ සෑම විටක ම වාහනය හැඳින්වීමේ දී ජීප් රථය ලෙස ට හඳුන්වා ඇති කරුණ පිළිබඳ ව 01,02 චූදිතයන් වෙනුවෙන් ප්‍රශ්න කිරීමේ දී ද ඒ හා සම්බන්ධ ව හබ කර ඇති බව පැහැදිලිය.

දුම්රිය හරස් මග අසල තමා සිටින විට ඒ අවස්ථාවේ පොඩි චමීර ද සිටි බව ට, ඇල්පිටිය පොලිස් ස්ථානය ට ලබා දුන් ප්‍රකාශයේ දී සටහන් කර තිබීම පිළිබඳ ව මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කර සිටින ලදි. පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ගේ ස්ථාවරය වන්නේ, ඒ අවස්ථාවේ පොඩි චමීර නොසිටි බවය. එසේ සිටි බව ට ඇල්පිටිය පොලිස් ස්ථානය ට ලබා දුන් ප්‍රකාශයේ සඳහන් නොකල බව ට පැමිනිල්ලේ පස්වන සාක්ෂිකරු ප්‍රකාශ කරයි. " වි.14"[7] ලෙසට ලකුණු කරන ලද්දේ එකී පරස්පරතාවය යි.

පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ඉහත කී දුම්රිය හරස් මග අසල ට යන ලද්දේ, කොත්තු රොටියක් ගැනීම ට යන කාර්යය පොලීසිය ට ලබා දුන් කට උත්තරයේ සඳහන් නොකල කරුණ ඌණතාවයක් ලෙසට ද අධිකරණයේ අවධානය ට යොමු කිරීම ට 01,02 චූදිතයන් වෙනුවෙන් කටයුතු කර ඇත. මෙම සාක්ෂිකරු විසින් පොලිස් ස්ථානයේදී ස්වාමීන් වහන්සේ නමක් හමු වූ බව ට කියන කරුණ චූදිතයන් වෙනුවෙන් හබ කර සිටී. පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කිරීමේ දී තමා ස්වමීන් වහන්සේ නමක් දුටුවේ කුමන ස්ථානයක දී ද, යන්න ස්ථාරව ම කියා සිටීම ට අසමත් විය.

තුවාලකරු බලපිටිය රෝහල ට ගෙන යාමේදි තමන්ලා ඔහු ව ජීප් රථයෙන් බස්වාගෙන ඔවුන් ගමන් ගත් ත්‍රීරෝද රථය ට නංවාගත් බව ට පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ප්‍රකාශ කල ද එය ස්ථාර වශයෙන් ම සිදු කල ක්‍රියාවක් ද කුමන ස්ථානයේදී කරන ලද්දක් ද යන්න පැහැදිලි කිරීම ට සාක්ෂිකරු අසමත් විය. එසේම පොලිස් නිළධාරීන් බාරයේ සිටින සැකකරුවෙකු සාමාන්‍ය පුද්ගලයෙකුට තම බාරයට ගත නොහැකි යහ. එය නීති විරෝධී කටයුත්තක් වේ. පැමිණිල්ල විසින්

[7] මම සමග ගමේ පදිංචි පොඩි චමීර යන අයත් සිටියා.

13 MAY 2019
බලපිටිය

කැඳවන ලද සාක්ෂිකරුවන් ට එවැනි නීති විරෝදී කටයුත්තක් කිරීමේ අවස්ථාවක් උදාවූ බව ට ප්‍රකාශ කල කරුණ සැක සහිත තරුණකි.

අධිකරණය ඉදිරියේ වූ මූලික සාක්ෂියේදී පොලිස් නිලධාරීන් නම් වශයෙන් හඳුනා ගත්තද, දුම්රිය හරස් මග අසල දී ඔහු ප්‍රකාශ කරන පරිදි වූ වාහනය තුල කුමන නිලධාරීන් සිටියේ ද යන්න පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු හඳුනාගෙන නැත. එම සාක්ෂිකරු ගේ පෙන්වා දීම මත විමර්ශනයේ දී විමර්ශන අවස්ථාවේ දී හෝ කිසිදු සැකකරුවෙකු හඳුනා ගත් බව ට කරුණු හෙළිදරව් වී නැති අතර, මොහු විසින් පෙරට්ටුවක දී වත්, චූදිතයින් හඳුනා ගන්නා ලද අයෙකු නොවේ. ඒ අනුව පැහැදිලි වන්නේ චූදිතයින් නම් වශයෙන් මුලින් ම හඳුනාගෙන ඇත්තේ විවෘත අධිකරණයේ දී බව යි.

මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී පිලිගෙන ඇති පරිදි පැමිණිල්ලේ පලමු සාක්ෂිකාර කමල් ප්‍රියන්ත යන අය දුම්රිය හරස් මග අසල වාහනය තුල දී දුටු අවස්ථාවේ තමා ව බේරා ගැනීම ට පමණක් අයදින ලද බව ට ප්‍රකාශ කර ඇත. ඔහුගේ ම සාක්සිය පරිදි පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු විසින් තමා ට සිදු කල පහර දීම පිළිබඳව පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ට ප්‍රකාශ කර ඇත්තේ පසුවය. පළමු චූදිත පැමිණිල්ලේ පළමු සාක්ෂිකාර කමල් ප්‍රියන්ත හට පහර දුන් බව ට කමල් ප්‍රියන්ත විසින් පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ට ප්‍රකාශ කල බව සාක්ෂිකරු හෙළි කරයි. එසේ ප්‍රකාශ කර ඇත්තේ, ඔහු ම ප්‍රකාශ කරන පරිදි පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ඇල්පිටිය පොලිස් අධිකාරී කාර්යාලයේ සිදු කල පරීක්ෂණයේ දී කට උත්තර ලබා දීම ට පෙරය. නමුත් පළමු චූදිත විසින් තමා ට පහර දුන් බව ට එම කට උත්තරයේ සඳහන් ව නොමැති නම් එම කට උත්තරය ලබා දෙන විට තමා එවැන්නක් පොලිස් ස්ථානය ට ප්‍රකාශ කර නොමැති බව පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු පිලිගන්නා ලදි. මෙය ඉතා ම වැදගත් කාරණාවක් වන අතර, එසේ තමා දැන සිටි කරුණු තම කට උත්තරයේ ඇතුලත් නොකරන ලද්දේ කුමන හේතුවක් නිසා ද යන්න මෙම සාක්ෂිකරු පැහැදිලි කර නැත.

පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ගේ ස්ථාවරය වන්නේ පහර දීම පිළිබඳ ව සවිස්තරව කමල් ප්‍රියන්ත යන අය විසින් ප්‍රකාශ කරන ලද්දේ ඔහු රෝහල් ගත කල පසු ව බව යි. නමුත් ඒ හා සම්බන්ධ ව මෙම සාක්ෂිකරු ම සිය සාක්ෂියේ දී පිළිගෙන ඇත්තේ මෙසේය.[8]

ප්‍ර: තමන් මෙහෙම තමයි පොලිසිය ට කිව්වේ, " රෝහලේදී මම ඔහු සමග කථා කලා. එතැන දී ඔහු මට පහර දුන් අය නම් වශයෙන් කිසිවෙකු ගැන කිව්වේ නැහැ." එහෙම කිව්වා නේද? තමන් දීපු කට උත්තරේ ලියලා තියෙන්නේ බලන්න. එහෙම කිව්වා කියලා පිළිගන්නවා ද, පොලිසිය ට?

උ: (සාක්ෂිකරු එම ලේඛනය කියවා බලයි.) පිලිගන්නවා.

ප්‍ර: එතකොට තමන් ට කියන්නේ අතුකෝරල මහත්තයා තුවක්කුවෙන් ගැහුවා කියලා කිව්වා කියලා නඩුකාර හාමුදුරුවන්ට කිව්වා නේ?

උ: ඔව්.

[8] 2014.02.26 සටහන්, පිටුව 04

13 MAY 2019

ප්‍ර: නමුත් තමන් තුවක්කුව ගැන තමන් පොලීසිය ට දීපු කට උත්තරේ වචනයක්වත් ප්‍රකාශ කරලා නෑ. තමන් පිලිගන්නවා ද?

උ: පිළිගන්නවා.

ප්‍ර: දෙවන විත්තිකරු ගේ නම සඳහන් කලා කියලා තමන් කිව්වා. ජයරත්න ගේ නම?

උ: ඔව්.

ප්‍ර: තමන් පොලීසිය ට දීපු කට උත්තරේ කොතනකවත් ජයරත්න කියන නම සඳහන් වෙලා නෑ. පොලීසියට දීපු කට උත්තරේ. ඒක පිලිගන්නවාද?

උ: නෑ ස්වාමීනී. පොලීසියට දීපු කට අත්තරේ නෙවෙයි මම කියන්නේ. කමල් මාත් එක්ක පැවසුවා පසු ව, මේ නිලධාරීන් තුන්දෙනා තමයි සිද්ධිය ට හිටියේ කියලා. මට හරි අවබෝධයක් නෑ පොලීසියේ දී ඒ නම් දෙක කිව්වා ද කියලා.

ප්‍ර: ජයරත්න කියන නම සඳහන් වෙලා නැත්නම් පිලිගන්නවා ද කිව්වේ නැහැ කියලා?

උ: සඳහන් වෙලා නැත්නම් මම පිලිගන්නවා කිව්වේ නෑ කියලා.

ඒ අනුව පෙනී යන්නේ සාක්ෂිකරු පොලිස් ස්ථානයට කටඋත්තරය ලබා දෙන විට වත් පළමු වූදිත පහර දුන් බවට කියන කරුණ හා සම්බන්ධයෙන් දැන නොසිටි බවයි. එම කරුණ හරි හැටි දැන ගත් බවට ඔහු නිශ්චිත අවස්ථාවක් ද ප්‍රකාශ කරන්නේ නැත. සමස්ථයක් ලෙස ගත් කල මෙම කරුණ පළමු වූදිත හඳුනාගැනීම හා සම්බන්ධ සාක්ෂිය අස්ථාවරභාවය ට පත්වීම ට හේතු ය.

13 MAY 2019

වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේ දී පහර දුන් අය පිළිබඳ ව ප්‍රකාශ කලේ, කුමන අවස්ථාවේ දී ද යන්න මතක නැති බව ද මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත.

වූදිතයන් තිදෙනා හඳුනා ගැනීම හා සම්බන්ධ ව මෙම සාක්ෂිකරු මෙසේ ද ප්‍රකාශ කර ඇත.[9]

ප්‍ර: තමන් ගිය අවස්ථාවේ ගරු විනිසුරුතුමා ට කිව්වා මීටියාගොඩ පොලීසියේ සිට බටපොල ට සහ බලපිටිය ආරෝග්‍යශාලාව ට ගෙනියන අවස්ථාවේ දී පළමු විත්තිකරු හිටියා කියලා කිව්ව නේද?

උ: මම හරියට ම අඳුර ගත්තෙ ඉස්පිරිතාලේ දි තමයි.

ප්‍ර: මම තමන්ට යෝජනා කරනවා මීටියාගොඩ පොලීසියේ සිට ආරෝග්‍ය ශාලාවල ට ගෙනියන කිසිම අවස්ථාවක පළමු විත්තිකරු ඒ ගමන් වල ට සහභාගී වුනේ නෑ කියලා. මොකද කියන්නෙ?

උ: මා පැවසුවේ මේ නිලධාරීන් තුන් දෙනා ම මා බලපිටිය රෝහලේ දී හඳුනා ගත් බව ට තමයි කලින් මා ප්‍රකාශ කලේ.

ඔහු ගේ ම සාක්ෂිය අනුව සිද්ධිය සිදු වූ දින ම වූදිතයන් හඳුනාගත් බව ට ප්‍රකාශ කර ඇතත්, එසේ හඳුනා ගත්තේ නම්, ඔවුන් ගේ නම් සිය කට උත්තරවල සඳහන් කිරීම ට නොහැකි වූ කාරණය පිළිබ ඳ ව මෙම සාක්ෂිකරු පැහැදිලි කර නැත.

---

[9] 2014.02.26 සටහන් පිටුව 05

මෙම සාක්ෂිකරු සාක්ෂි දුන් විලාශයේ විශේෂත්වයක් වූයේ. පරස්පරතාවයක් හෝ ඌණතාවයක් මතු වෙතැයි බලාපොරොත්තු වූ සෑම අවස්ථාවක දී ම, තමා ට හරිහැටි මතක නැති බව ට කියා පෑම ට උත්සාහ කිරීම යි. යමෙකු ට යම් සිද්ධියක් පටිගත කල ආකාරය ට මතක තබා ගත නොහැකිය. එහෙත් එකී අමතක වීම සාධාරණීකරණය විය යුතු ය. නමුත් පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ගේ අමතක වීම පිළිබඳ සාක්ෂිය, චූදිතයින් ගේ අයිතිවාසිකම් හා සසඳන කල සහ පැමිණිල්ලේ ඔප්පු කිරීමේ බාරය හා සසඳන කල සාධාරණ බව ට අධිකරණය ට සෑහීමට පත්විය නොහැකිය.

තුවක්කුවෙන් පහර දුන් පුද්ගලයා පිලිබඳ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කල හැඩරුව අනුව රෝහලේ දී යම් පුද්ගලයෙකු පිළිබඳ ව අනුමාන කල බව පැමිණිල්ලේ පස්වෙනි සාක්ෂිකරු මෙසේ ප්‍රකාශ කරයි.[10]

ප්‍ර: රෝහලේ දී කමල් ප්‍රියන්ත තමන් ට කිවුවද එයාට ගහපු කට්ටියගේ නම් කිවුවද, එහෙම නැත්නම් එයා හැඩහුරු කම් මෙන්න මේ වගේ කට්ටිය කියලා ආපු අයගේ හැඩහුරු කම් කිවුවම තමන් නම් කිවුව ද එහෙම නම් මේ ගොල්ලෝ වෙන්න ඇති කියලා?

උ: රෝහලේ දී මට කිව්වා කමල් තුවක්කුවෙන් ගැහුවේ මෙහෙම පුද්ගලයෙක් කියලා. මම බලපිටිය රෝහලේ දී දැකපු නිසා ඉන් පස්සේ තමයි එහෙම ගෙස් කලේ.

මේ හා සම්බන්ධයෙන් වැඩි දුරටත් ප්‍රශ්න කිරීමේ දී නැවතත් මෙම සාක්ෂිකරු ප්‍රකාශ කරන්නේ පළමු චූදිත ගේ නම පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු විසින් ප්‍රකාශ කල බව කි. මේ ආකාරය ට ස්ථාවර සාක්ෂියක් පළමු චූදිත ගේ හඳුනා ගැනීම පිළිබඳ ලබා නොදීම පැමිණිල්ලේ නඩුව කෙරෙහි බලපෑම් ඇති කරයි. එසේම පැමිණිල්ලේ පස්වෙනි සාක්ෂිකරු ගේ සාක්ෂි අනුව ඔහු චූදිතයින් පැහැදිලි ව නිරික්ෂනය කර ඇත්තේ බලපිටිය රෝහලේ දී ය. පළමු චූදිත හා සම්බන්ධයෙන් ද අනුමාන කල බව (ගෙස්) ඔහුගේ ස්ථාවරය යි. යම් අනුමාන කිරිමක් මත චූදිතයෙකු කිසිදු චෝදනාවක ට වරදකරුවෙකු කල නොහැකි ය.

පහර දීම සිදු වූයේ ගෙවල් 20 අසල දී බව ට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කල බව ට පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ප්‍රකාශ කරයි. ගෙවල් 20 ප්‍රදේශය හා කහව දුම්රිය පොල යන ස්ථාන යන් වෙන් වශයෙන් වූ ස්ථාන දෙකක් බව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය මගින් ම පැහැදිලිය. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ට අනුව ද ගෙවල් 20 ප්‍රදේහය හා දුම්රිය පොල අතර මීටර් 150 ක් පමණ දුරය. ඒ අනුව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු විසින් තමන් ට පහර දුන බව ට පැමිනිල්ලේ පස්වන සාක්ෂිකරු ට ප්‍රකාශ කල ස්ථානය සැලකීමේ දී ත් මෙම පහර දීම හා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන සාක්ෂිය කෙරෙහි සැක උපදවයි. පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු සිය මූලික සාක්ෂියේ දී ප්‍රකාශ කර ඇත්තේ තුවාල කරු ට පහරදීම ජීප් රථයෙන් බැසීම ට යාමේ දී සිදුකරන ලද බව යි. පැමිණිල්ලේ පලමු සාක්ෂිකරු ගේ ස්ථාවරය වන්නේ තමා ට පහර දෙන ලද්දේ කහව දුම්රිය පොල ස්ථානය අසලදී ජීප් රථය තුලදී පහරදුන් බව යි. ඉහත කරුණු අනුව පහර දුන් බව ට කියා සිටින

13 MAY 2019

[10] 2017.02.26 සටහන් 6,7 පිටු

ස්ථානයෙන් පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ගේ සාක්ෂිය තුල මෙන් ම පැමිණිල්ලේ පළමු හා පස්වන සාක්ෂිකරු ගේ සාක්ෂි සැසඳීමේ දී පරස්පරතා පෙන්නුම් කරයි.

පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ට පහරදීම පිළිබඳ ව ලබා දුන් කට උත්තරයේ දී තුන්වන චූදිතගේ නම එකී කට උත්තරයේ සඳහන් නොවන්නේ නම් තමා විසින් එය පොලිස් ස්ථානය ට ප්‍රකාශ නොකල බව වද පැමිනිල්ලේ පස්වන සාක්ෂිකරු පිලිගන්නා ලදි. සිද්ධිය සිදුවූ දිනයේ දී ම මේ හා සම්බන්ධ ව සාක්ෂිකරු දැන සිටියේ නම් එය පොලීසිය ට ලබා දුන් කට උත්තරයේ දී සඳහන් නොකිරීම ට හේතුවක් ද සාක්ෂිකරු ඉදිරිපත් කර නැත.

පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී හෙලිදරව් වූ තවත් කරුණක් වූයේ මෙම නඩුවේ සාක්ෂි දීම ට පෙර පැමිණිල්ලේ පලමු සාක්ෂිකරු ට තුවාල සිදුවීම හා සම්බන්ධයෙන් වූ මූලික අයිතිවාසිකම් නඩුව පැවරීම ට පෙර ඇති වූ සාකච්ඡා සඳහා ද පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු සම්බන්ධ වී ඇති බව යි. මෙම සාක්ෂිකරු ගේ සාක්ෂියේ විලාශය අනුව කුමන අවස්ථාවක හෙලිදරව් කරගත් කරුණු මත පැමිණිල්ලේ පස්වන සාක්සිකරු සාක්ෂි දුන්නේ ද යන කරුණ කෙරෙහි ද සාක්ෂි විශ්ලේෂණයේ දී අවධානය යොමුකල යුතු ය. ඉහත කරුණු අනුව පහර දුන් බවට කියන අය හඳුනාගැනීම පිළිබඳව මෙම සාක්ෂිකරු ගේ සාක්ෂිය සැක සහිතය.

ඉහත කරුණු අනුව පැමිණිල්ලේ පස්වන සාක්ෂිකරු ගේ සාක්ෂිය විශ්වාසනීයත්වයෙන් තොර සාක්ෂියක් වන අතර එමගින් අධිචෝදනීය වරද ට අදාල පැමිණිල්ලේ පලමු සාක්ෂිකරු ගේ සාක්ෂිය තහවුරු වී ඇති බව ට අධිකරණය ට සෑහීමට පත්විය නොහැකිය.

පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු සාක්ෂියට කැඳවන ලද්දේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු පොලිස් ස්ථානය ට රැගෙන යාමෙන් පසුව සිදුවූ බව ට කියා සිටින සිද්ධීන් පිළිබඳ ව සනාථ කිරීම ට ය. පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ කුඩා කල සිටම වූ මිතුරෙකි. මෙම සාක්ෂිකරු ශ්‍රේෂ්ඨාධිකරණය ට ඉදිරිපත් කල මූලික අයිතිවාසිකම් නඩුව සඳහා ද දිවුරුම් ප්‍රකාශයක් ලබා දී ඇත. එකී දිවුරුම් ප්‍රකාශය A1 ලෙස ට ලකුණු කර ඇත. එම ලේඛණය ඔප්පු කිරීමේ බාරය ට යටත්ව ලකුණු කරන ලද්දක් බව ට සටහන් තබා ඇත. එහෙත් කුමන පාර්ශවයකගේ විරෝධතාවය මත එම ලේඛණය ඔප්පු කල යුතු ද යන්න දක්වා නැත. තව ද එම ලේඛණයේ ඇති අත්සන 04 වෙනි සාක්ෂිකරු පිලිගන්නා ලදි. ඒ අනුව ඒ 1 දරන ලේඛණය ඔප්පු කිරිමට අවහය ලේඛණයක් වන්නේ නැත

පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරුගේ ස්ථාවරය වන්නේ ඒ1 ලේඛණය තමා කියවා බලා අත්සන් කරන ලද්දක් නොවන බවය. නමුත් එය කියවා තේරුම් කල බවට සහතික කල ලේඛණයකි. කියවා තේරුම් කර දීමකින් තොර ව ලේඛනය අත්සන් කලේ නම් එය ද, ලේඛණයක් කියවා තේරුම් කර දුන් බව ට සටහන් ව තිබිය දී, ලේඛණය තමා ට කියවා නොදුන් බව ට ප්‍රකාශ කිරිම ද පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරුගේ සාක්ෂියේ විශ්වාසනීයත්වය හීන වීමට හේතු වේ.

මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය වන්නේ තමා ට ලද දුරකථන ඇමතුමක් අනුව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුව මීටියාගොඩ දෙස ට රැගෙන යන බව ට දැන්වීම මත යහලුවකුගේ බයිසිකලයක් සොයාගෙන ප්‍රසන්න යන අය සමග පොලිස් ස්ථානය ට යන ලද බව යි. ඒ යන විට වෙලාව රාත්‍රී 7.30 ත් 8.00 ත් අතර වූ බව සාක්ෂිකරු ගේ ස්ථාවරය යි. නමුත් වී.15 පරස්පරතාවය [11] අනුව පැමිණිල්ලේ හතරවන සාක්ෂිකරු ප්‍රකාශ කර ඇති වෙලාව රාත්‍රී 10.00 හෝ රාත්‍රී 10.00 පසු වී ඇති බව ට වේ. එසේම බයිසිකලයක් සොයාගෙන යහලුවකු සමග පොලීසිය ට ගිය බව මූලික සාක්ෂියේ දී කියා සිටින සාක්ෂිකරු හරස් ප්‍රශ්න විමසීමේ දී මෙන් ම අධිකරණය මගින් ප්‍රශ්ණ කිරීමේදී ද ප්‍රකාශ කර ඇත්තේ බයිසිකලයෙන් මගට ගොස් ත්‍රීරෝද රථයකින් තවත් පුද්ගලයින් සමග පොලිස් ස්ථානය ට ගිය බව යි. වි.15 පරසපරතාවය අනුව සාක්ෂිකරු පොලිස් ස්ථානය ට ප්‍රකාශ කර ඇත්තේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු පොලිස් ස්ථානය ට රැගෙන ගිය කාරණාව පුද්ගලයින් දෙදෙනෙකු පැමිණ තමා ට කිවූ බව යි. එම කාරණාව ද ඔහුගේ සාක්සිය අනුව පරස්පර විරෝධීය.

වි.16[12] ලෙස ලකුනු කිරීමට යෙදුනු පරස්පරතාවය අනුව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගේ මව සහ පියා පොලිස් ස්ථානයේ සිටි බවට පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු නොදුටු බව ඔහුගේ ස්ථාවරය වුවද පොලිස් ස්ථානයට ලබා දුන් කට උත්තරයේ ප්‍රකාශ කර ඇත්තේ මව සහ පියා පොලිස් ස්ථානයේ සිටි බව යි. මෙම කරුණ සිද්ධියෙන් පසුව ඇති වූ බවට කියන සිදුවීම් මත වූ පරස්පරතාවයක් වුවද, සමස්ථයක් ලෙස ගත් විට පැමිණිල්ලේ හතරවෙනි සාක්ෂිකරු ගේ විශ්වාසනීයත්වය හීන වීම ට එම පරස්පරතාවයන් හේතු ය.

කෙසේ හෝ පැමිණිල්ලේ හතරවෙනි සාක්ෂිකරුගේ සාක්ෂි අනුව ඔහු පොලිස් ස්ථානය ට යන විට කමල් යන අයගේ මව හා පියා එම ස්ථානයේ සිට නැත. මෙම සාක්ෂිකරු ප්‍රකාශ කරන පරිදි කමල් යන අයගේ ඇසින් ලේ ගලන ලද බවට ඔහු ප්‍රකාශ කරයි.නමුත් පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු කිසි විටෙකත් තම ඇසින් ලේ ගලන ලද බව ට ප්‍රකාශ කර නැත. එපමනක් නොව පැමිණිල්ලේ 05 වෙනි සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව ද පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගේ ඇසින් ලේ ගැලීමක් පිළිබඳ ව හෙලිදරව් කර නැත. ඒ අනුව මෙම සාක්ෂිකරු පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කරන සිදුවීමේ කුමන හෝ අවස්ථාවක ට සහභාගී වූ පුද්ගලයෙකු ද යන් න පවා සැක සහිතය.

13 MAY 2019

[11] 2014.05.22 දින සටහන් ප.ව.2.45 සිට ප.ව.3.00 දක්වා
[12] 2014.05.22 දින සටහන් ප.ව.2.45 සිට ප.ව.3.00 දක්වා පිටුව 4

බලපිටිය රෝහලේ සිට පැමිණිල්ලේ පලමු සාක්ෂිකරු ව සාක්ෂිකරු ගේ මිතුරන් විසින් ත්‍රිරෝද රථයක නංවාගෙන එන විට පහර දීමක් පිළිබඳ ව විමසීමේ දී ටී 56 අවියෙන් පහර දුන් බව ට ප්‍රකාශ කල බව පැමිණිල්ලේ හතරවෙනි සාක්ෂිකරු හෙලිකරයි. මෙම සාක්ෂිකරු ගේ සාක්ෂිය අනුව ගිලන් රථයෙන් කරාපිටිය රෝහලට රැගෙන යන විට පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු ද ගිලන් රථයේ ගොස් ඇත. නමුත් කරාපිටිය රෝහලට යන තුරුම තමා ට පහර දුන් අයෙක් පිළිබඳ ව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ නොකල බව පැමිණිල්ලේ හතරවෙනි සාක්ෂිකරු ප්‍රකාශ කරයි.

මූලික ප්‍රශ්න විමසීමේ දී පැමිණිල්ලේ හතරවෙනි සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ කරාපිටිය රෝහලේ සිටින විට, අතුකෝරල රාලහාමි තමා ට පහර දුන් බව ට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු කිවූ බවයි. එසැනින් නැවත සාක්ෂිකරු ප්‍රකාශ කරන්නේ එසේ ප්‍රකාශ කරන ලද්දේ බලපිටිය රෝහලේ දී බවයි. වැඩිදුරටත් මූලික ප්‍රශ්න කිරීමේදී පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු නැවත ප්‍රකාශ කරන්නේ තමාට අතුකෝරල රාලහාමි පහර දුන් බව ට කරාපිටිය රෝහලේ දී ප්‍රකාශ කල අතර, බලපිටිය රෝහලේ දී එසේ නොකී බව යි. තවදුරටත් පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු මේ පිළිබඳ ව ප්‍රකාශ කරන්නේ බලපිටිය හා කරාපිටිය යන ස්ථානයන් දෙකේ දී ම පළමු වූදිත විසින් ඔහුට ටී 56 අවියෙන් පහර දුන් බවට දැන් වූ බව යි. පැමිණිල්ලේ පලමු සාක්ෂිකරු එසේ මූලික සාක්ෂියේදී [13] තුවාල සිදුවීම හා සම්බන්ධයෙන් තමාට ප්‍රකාශ කරන විට චමීර යන අය ද ඇඳ ලඟ සිටිය දී තම මව ට තුවාල වූ ආකාරය ප්‍රකාශ කල බව යි.

ප්‍ර: ඇහැට තුවාල වුනේ කොහොමද කියලා කතා කලාද?

උ: ඒ වෙලාවේ කිව්වා.

ප්‍ර: මොකක්ද?

උ: මම කිව්වා මම කිසිම වරදක් නොකර පොලීසියෙන් ආපු කට්ටිය ගැහුවා කියලා.

ප්‍ර: ඒ වෙලාවේ චමීර හිටියේ කොහෙද?

උ: ඇඳ ලඟ

ප්‍ර: තවත් මොනව හෝ කිව්වද?

උ: නැහැ.

ඒ අනුව එක් කාරණාවක් වන්නේ මේ අවස්ථාව වන විට පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු ඒ අසල නොසිටි අයෙකු වන අතර ත්‍රිරෝද රථයේ පැමිණෙන ලද බව ට කියූ අවසථාවේ ද මෙම සාක්ෂිකරු සිට නැත. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කරන පරිදි ත්‍රිරෝද රථයේ පැමිණ ඇත්තේ චමීර යන අය සහ ප්‍රසන්න යන අය පමණි.

13 MAY 2019

---

[13] 2014.02.06 දින ප.ව.2.35 සිට 2.50 පිටු 08,09

මෙම සාක්ෂිකරුගෙන් අධිකරණයෙන් විමසීමේදී, [14] මෙසේ ප්‍රකාශ කර ඇත.

ප්‍ර: තමුන්ට ගැහුවේ අතුකෝරල කියල කිව්වා. අනිත් දෙන්නාගේ හැඩරුව මුල් වතාවට කිව්වේ වැලි අමුණ මහත්තයා ගාව?

උ: මම ගෙදරට ඇවිල්ල කිව්වා.

ප්‍ර: තමුන් ඉස්සර වෙලා කිව්වෙ වැලිඅමුන මහත්තයා ගාවට ගියාට පස්සේ තමයි තමුන්ට ගැහුවේ අතුකෝරල කියලා?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සෙ ප්‍රසන්න කිව්වා ජයරත්නයි ඉන්දිකයි කියලා?

උ: ඔව්.

ඒ අනුව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ද වරෙක ප්‍රකාශ කරන පරිදි අතුකෝරල යන අය පහර දුන් බවට ඔහු මුල් වතාව ට ප්‍රකාශ කර ඇති බව ට හෙලි දරව් කරන්නේ නිතීඥ වැලිඅමුණ යන අයගේ ඉදිරියේ බව ට ද පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. එවන් තත්වයක් යටතේ පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු ප්‍රකාශ කරන පරිදි ඊට පෙර අවස්ථාවක මෙසේ දැනගත් බව ට කියන කාරණය සැක සහිත කාරණාව කි.

පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු පළමු වූදිත ව බලපිටිය රෝහලේ දී දුටු බවට ප්‍රකාශ කර ඇති අතර එය ද ප්‍රසන්න යන අය පෙන් වූ පසුව බව මෙම සාක්ෂිකරු ගේ ස්ථාවරය යි.

පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු විසින් පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු වෙත, තමාට පහර දුන් අය පිළිබඳව මුල් අවස්ථාවේ දී ම ප්‍රකාශ කලේ නම් එය වැදගත් සාක්ෂිය කි. පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු පිලිගත් කරුණක් වූයේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු විසින් තුවක්කුවකින් තමාට පහර දුන්නේ ද යන්න මතක නැති බව ප්‍රකාශ කල බව යි. ඒ බව තමා 2008.06.10 දින පොලිස් ස්ථානයට කල ප්‍රකාශයේද සඳහන් කල බවයි. එසේම එකී පොලිස් කට උත්තරයේදී " ඔහු ඔහුට පහර දීපු කිසිවකුගේ නමක් ඔහු මට කිව්වේ නැත. " යනුවෙන් පොලිසියට ප්‍රකාශ කල බව ද පිලිගෙන ඇත. එම ස්ථාවරය නැවත වෙනස් කරමින් සාක්ෂිකරු ප්‍රකාශ කරන්නේ පහර දුන්

13 MAY 2019

[14] 2014.02.06 දින ප.ව. 3.20 සිට 3.35 සටහන් 09 පිටුව

අයගෙ නම් කමල් තමාට කියූ බව යි. ඉහත කී පරිදි වූ කරුණු මත සාක්ෂිකරුගේ සාක්ෂියේ ඇති අස්ථාවර භාවය ඔහුගේ සාක්ෂියේ විශ්වාසනීයත්වයට දැඩි බලපෑමක් ඇති කරයි.

පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු 2008.06.10 දින පොලිස් ස්ථානයට දුන් ප්‍රකාශයේ පමණක් නොව 2008.07.16 දින ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කල දිවුරුම් ප්‍රකාශයේ වත්, පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු විසින් පලමු චූදිතට පහර දුන් බවට ප්‍රකාශ කර නැති කරුණ 01,02 චූදිතයන් වෙනුවෙන් හෙළිදරව් කරන ලදි. ඒ අනුව පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු විසින් පළමු චූදිත පහර දුන් බව ට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කල බව ට කියා සිටින කරුණ පිලිගැනීම සුදුසු වන්නේ නැත. පොලිස් ස්ථානයට ප්‍රකාශ නොකරන ලද්දේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ඒ බව ප්‍රකාශ කල නිසා බවට පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු කියා සිටියද පැමිණිල්ලේ 04 වෙනි සාක්ෂිකරු ගේ සමස්ථ සාක්ෂිය සලකා බැලීමේ දී ඔහුගේ සාක්ෂිය විශ්වසනීයත්වයෙන් තොර සාක්ෂිය කි. තව ද පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු එම කරුණ පොලිස් ස්ථානයට ප්‍රකාශ කලේ ද නොකලේ ද යන කරුණ තමා කෙසේ දැන ගන්නා ලද්දේ ද යන වග වත් මෙම සාක්සිකරු පැහැදිලි කර නැත. එබැවින් මෙමම සාක්ෂිකරු එසේ පොලීසියට ප්‍රකාශ නොකිරීම ඔහුගේ සාක්ෂියේ බරපතල ඌණතාවයකි.

අධිචෝදනාව ට අදාල සිද්ධිය ට මුහුණ දුන් බව ට කියා සිටින එකම සාක්ෂිකරු පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු වේ. ඔහු විසින් මෙම නඩුවේ චූදිතයින් හඳුනා ගැනීම පිළිබඳ ව කටයුතු කර ඇති ආකාරය සලකා බැලිය යුතුය. [15] පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු 1 සිට 3 චූදිතයන් ව මින් පෙර හඳුනන අයෙකු නොවේ.

ප්‍ර: මේ ප්‍රකාශය කලේ 2008.07.19 වෙනිදා ඒක තමයි අපේ ළඟ තිබෙන ලේඛණ අනුව පළමුවෙන් ම කරන ලද ප්‍රකාශය. මේ සිද්ධිය සිදුවීමෙන් අනතුරුව?

උ: එහෙමයි ස්වාමීනී.

ප්‍ර: ඒකේ කොතනකවත් කියලා නැහැ තමන්ගේ ඇඟට පොලිස් නිලධාරීන් පහර දුන් බව, (එම ප්‍රශනය ඉල්ලා අස්කර ගනී.)

ප්‍ර: මේ ප්‍රකාශයේ 10.07.2008 දා පොලිසියට කරපු ප්‍රකාශයේ කොතනකවත් කියලා නැහැ පොලිස් නිලධාරියෙක් තමන් ට ඇඟට පහරක් ගහපු බව?

(එය ඌණතාවයක් වශයෙන් ලකුණු කරනවා)

එසේ අවධානය ට යොමු කරන ලද කරුණ අනුව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව ලබා දුන් ප්‍රථම කට උත්තරයේ දී වත් තමා ට පොලිස් නිලධාරීන් පහර දුන් බව ට සඳහන් කර නැත. නමුත් ඊට සාධාරණ හේතුවක් ද තිබිය හැකිය. මන්ද එකී කටඋත්තරය ලබා දී ඇත්තේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු සැකකරුවකු ලෙස ට ඉදිරිපත් කල අවස්ථාවේ, පොලිස් අත්අඩංගුවේ සිටිය දී ය. එබැවින් එහි දී එවැනි ප්‍රකාශයක් කල හැකිව තිබුනේ යැයි බලාපොරොත්තු විය නොහැකිය.

[15] 2014.02.13 දින සටහන් පස්වරු 4.40 සිට 4.55 දක්වා, පිටුව 02

13 MAY 2019

උප සේවයේ රාජකාරී සනාථ කිරීම සහ පැහැදිලි කිරීම සඳහා ද 2,3 චූදිතයන් වැටලීම සඳහා සහභාගී වූ කාරණාව සනාථ කිරීම සඳහා ද උප සේවයේ සටහන් යොදන ආකාරය සනාථ කිරීම සඳහා ද පැමිණිල්ලේ 12 වන සාක්ෂිකරු කැඳවන ලදි. එකී සාක්ෂි මගින් පැ.3ඒ සිට පැ.3 ඉ ලේඛණද සලකුණු කරන ලදි. 2,3 චූදිතයන් වැටලීම සඳහා සහභාගී වීම පිළිබඳව හබයක් නොමැති අතර, එම සාක්ෂිකරු විසින් මෙම නඩුවේ 3 වන චූදිත විසින් යොදන ලද සටහන් තහවුරු කරන ලදි.

පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු සාක්ෂි ඉදිරිපත් කිරීමේ දී වෙඩි තැබීමක් පිළිබඳව ප්‍රකාශ කර ඇත. වෙඩි 03ක් තැබූ බව ඔහුගේ ස්ථාවරය යි. පැමිණිල්ලේ 05 වන සාක්ෂිකරු ද ප්‍රකාශ කර ඇත්තේ තමා ට වෙඩි වැනි හඬක් ඇසුනු බවයි. වි.10 දරණ පරස්පරතාවය අනුව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කල පෙත්සමේ හා ඊට අනුශංගිත දිවුරුම් ප්‍රකාශයේ, අහසට වෙඩි තබනු තමා දුටු බවට ප්‍රකාශ කර ඇත. සාක්ෂිකරුගේ ස්ථාවරය වන්නේ එකී ප්‍රකාශය වැරදි බවයි. ශ්‍රේෂ්ඨාධිකරණයට එසේ වෙඩි තබනවා දුටු බවට කියා සිටිය ද තුන්වන චූදිත භාරගත් උණ්ඩ සියල්ල නැවත උප සේවයට අවිය සමග භාර දී ඇත. පැමිණිල්ලේ 08 වන සාක්ෂිකරුගේ සාක්ෂි අනුව එය තහවුරු වේ. ඒ අනුව එක්කෝ වැටලීම ට ගිය පොලිස් නිලධාරීන් වෙඩි තැබීමක් සිදු කර නැත. නැත්නම් යම් හෙයකින් වෙඩි තැබීමක් සිදුව ඇත්නම් එය නිලධාරීන් සිදු කල වෙඩි තැබීමක් නොවේ. මෙමගින් හෙලි වන්නේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පවා සත්‍ය නොවන කරුණු ප්‍රකාශ කර ඇති බව යි.

පැමිණිල්ලේ පළමු සහ 05 වන සාක්ෂිකරුවන් විසින් ප්‍රකාශ කල පරිදි පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු අත්අඩංගුවට ගැනීමේ දී ජීප් රථයක් එසේත් නොමැති නම් කැබ් රථයක් උපයෝගී කර ගෙන ඇත. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කල පරිදි එය පදවා ඇත්තේ පොලිස් නිලධාරියෙකි. චූදිතයන් මෙම ස්ථාවරය ප්‍රතික්ෂේප කරයි. ඔවුන්ගේ ස්ථාවරය වන්නේ පැමිණිල්ලේ පලමු සාක්ෂිකරු රැගෙන එන ලද්දේ ත්‍රීරොද රථයකින් බව යි. 03 වන චූදිත ඇතුලු කන්ඩායම මෙම වැටලීම සඳහා පොලිස් ස්ථානයේ වාහනයකින් නොගිය බව ට පැමිණිල්ල විසින් සාක්ෂියට කැඳවන ලද පැමිණිල්ලේ 08 වන සාක්ෂිකරු ද ප්‍රකාහ කරයි. මෙවන් තත්වයක් යටතේ පොලිස් ස්ථානයේ කැබ් රථයක් හෝ ජීප් රථයක් වැටලීම සඳහා යොදා ගත්තා ද යන කරුණ සැකයට භාජනය වන කරුණකි. පැමිණිල්ලේ පලමු සාක්ෂිකරු ප්‍රකාශ කරන පරිදි ඊට උපයෝගී කරගෙන ඇත්තේ පොලීසියේ බව ට කියා සිටින වාහනයක් වුවත් පැමිණිල්ලේ ම සාක්ෂි අනුව එවැනි වාහනයක ට අදාල පිටවීමේ සටහනක් හෝ ඇති බවට හෙලිදරව් වන්නේ නැත.

එය එසේ වුයේ නම් පොලිස් වාහනයක් තුල පහර දීමක සිදුවීමක් පිළිබ ද ව සාක්ෂිය සාධාරන සැකයෙන් තොරව ඉදිරිපත් කල සාක්ෂියක් ලෙස ට භාර ගැනීම ට නොහැකි ය. එසේ නම් පැමිණිල්ලේ 05 වන සාක්ෂිකරු විසින් පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ව කහව දුම්රිය හරස්මග අසල ජීප් රථයක් තුල හෝ කැබ් රථයක් තුල සිටිනු දුටු බව ට කියා සිටින සාක්ෂිය ද විශ්වාස කල නොහැක්කක් වේ. පැමිණිල්ලේ 05 වන සාක්ෂිකරු දුම්රිය හරස් මග අසල ට පැමිණෙන ලද්දේ කොත්තු රොටියක් ගෙන යාම ට කියා ප්‍රකාශ කල ද ඒ බව එම සාක්ෂිකරු තම කට උත්තරයේ වත් සඳහන් කර නැත. චූදිතයින් වෙනුවෙන් එකී කරුණ ඌණතාවයක් ලෙසට ද අධිකරණයේ අවධානයට යොමු කර ඇත. එකී ඌණතාවය තනිව සැලකූ කල පැමිණිල්ලේ 05 වන සාක්ෂිකරුගේ

13 MAY 2019

සාක්ෂියේ විශ්වසනීයත්වය ට බලපෑමක් ඇති නොකල ද පැමිණිල්ලේ සාක්ෂි අනුව නිලධාරීන් පොලිස් ස්ථානයේ ජීප් රථයකින් පිට නොවූ බව ට හෙළිදරව් කර තිබිය දී පැමිණිල්ලේ 05 වන සාක්ෂිකරු කහව දුම්රිය හරස් මග අසල දී පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු දුටු බවට කියන කරුණ කෙරෙහි සැක උපදවයි.

මීට අමතරව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගේ සාක්ෂිය ඉතාමත් අස්ථාවර සාක්ෂිය කි. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කරන්නේ තමන් ගෙවල් 20 ප්‍රදේශයේ තම ඉඩම ට පැමිණෙන ලද්දේ රැකියාවකට යාම සඳහා පොඩි චමීර යන අයගෙන් බැගයක් ඉල්ලා ගැනීමට බව යි. සාක්ෂිකරුට ඉඩමේ දී පොඩි චමීර මුණ ගැසී ඇත. එහෙත් බැගය පිළිබඳ ව වූ සාකච්ඡාව කෙසේ අවසන් කලේ ද යන්න මෙම සාක්ෂිකරු පැහැදිලි කර නැත. සාක්ෂිකරු පොඩි චමීර යන අටයගෙන් බැගයක් ලබා ගැනීම සඳහා අයදීමක් කර එය ලබා ගැනීම සිදු කර නැත. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගේ මූලික සාක්ෂිය පරිදි ම ඔහු පොඩි චමීර සමග රැකියාව පිළිබඳ ව සාකච්ඡා කලා මිස බැගය ලබා ගැනීම ට කතා කල බව ට ප්‍රකාශ කර නැත. රැකියාව පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ද පොඩි චමීර යන අය එම ස්ථානයේ රැඳී සිට ඇත. තමා යම් දුරකථන ඇමතුමක් ගත් බව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ ස්ථාවරය යි. ඒ අනුව ගෙවල් 20 ප්‍රදේශයේ පිහිටි තම ඉඩම ට යාම ට හේතු වූ බව ට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු කියා සිටි කාරණාව ඉෂ්ඨ කර ගැනීම සඳහා සාක්ෂිකරු කිසිදු ක්‍රියාවක් සිදු කර නැත. එසේ බැගයක් ලබා ගැනීමට ඉඩමට ගිය බවට කියා සිටින පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු, වි.2[16] පරස්පරතාවය පරිදි ප්‍රකාශ කර ඇත්තේ සපත්තු දෙකක් ලබා ගැනීම සඳහා එසේ යන ලද බවයි. මෙය එකිනෙකට වෙනස් ස්ථාවරයන් දෙකකි. එකී පරස්පරය හා බැගය ඉල්ලා ගැනීමට ඉඩමට ගිය බව ට කීව ද එවැනි බැගයක් ලබා ගැනීම සඳහා කිසිදු සාකච්ඡාවක් කල බව ට හෙළි නොවීම මත පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගෙවල් 20 ප්‍රදේශයට ගිය බවට කියා සිටින කාරණාව සාධාරණ සැකයෙන් තොරව සනාථ වන්නේ නැත.

පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කරන්නේ ජීප් රථය තුල පහර දීම සිදු කරන ලද්දේ තමාට වම් පසින් සිටි අය බවයි. නමුත් පැමිණිල්ලේ සාක්ෂි අංක 01 සිය මූලික අයිතිවාසිකම් කඩවූ බවට කියා සිටිමින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කල දිවුරුම් ප්‍රකාශයේ සඳහන් නොකිරීම ඌණතාවයක් ලෙසට අධිකරණයේ අවධානයට යොමු කරන ලදි. මෙම නඩුවේ චෝදනා හා සම්බන්ධ ව සලකන කල එය බලවත් අඩුපාඩුවකි.

ජීප් රථය අසලට පැමිණි බාහිර පුද්ගලයන් හා සම්බන්ධයෙන් සාක්ෂි දීමේදී සුසන්ත යන අයෙකු වාහනය අසලට පැමිණි කාරණාව පොලිස් ස්ථානයට ලබා දුන් කට උත්තරයේ සඳහන් නොකල කරුණ ද 01,02 චූදිතයන් වෙනුවෙන් අධිකරණයේ අවධානය ට යොමු කර ඇත. තව ද මූලික අයිතිවාසිකම් නඩුවේ ඉදිරිපත් කල දිවුරුම් ප්‍රකාශයේ ඉහත කී සුසන්ත යන අය පිළිබඳව සඳහන් නොකල කරුණ ද ඌණතාවයක් ලෙසට අධිකරණයේ අවධානය ට යොමු කරන ලදි. මේ අනුව සාක්ෂිකරු එක් එක් අවස්ථාවන් හි දී විවිධාකාරයෙන් සාක්ෂි දීම මගින් ඔහුගේ සාක්ෂියේ ඒකාකාරිභාවය බිඳ වැටෙන අතර එමගින් සාක්ෂියේ විශ්වසනීයත්වය නැති වී යයි.

13 MAY 2019

[16] 2013.11.11 දින සාක්ෂි සටහන් පස්වරු 12.30 සිට 12.45 දක්වා 4 පිටුව.

මූලික සාක්ෂියේ දී පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කරන ලද්දේ තමා රැකියාව ට යාම සඳහා බෑගයක් ඉල්ලා ගැනීම ට පොඩි චමීර යන අය හමුවීම ට ගිය බවයි. නමුත් පොඩි චමීර යන අය මෙම නඩුවේ සාක්ෂිකරුවකු නොවන බව ද පැමිණිල්ලේ ස්ථාවරය යි. 01,02 චූදිතයන්ගේ ස්ථාවරය වන්නේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු පොලිස් ස්ථානයට ලබා දුන් කට උත්තරයේ සඳහන් නොවන කරුණ ඒ පිළිබඳව ඔහුගේ සාක්ෂියේ වන ඌණතාවයක් බව යි. සාක්ෂිකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කල දිවුරුම් ප්‍රකාශයේ මෙම කරුණ සඳහන් නොකිරීම ද සාක්ෂියේ ඇති ඌණතාවයක් ලෙස අධිකරණයේ අවධානයට යොමු කරන ලදි.

පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ සාක්ෂිය ට අනුව තමා ට පහර දුන් අය අතුකෝරල යන යන බව ට හඳුනාගෙන ඇත්තේ පොල්ලක් අතැතිව තමා ට ඉදිරියෙන් සිටි අය අතුකෝරල යන අය ට, පහර නොදෙන ලෙස ට දැනුම් දීම නිසා බව ය. මෙම කරුණ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ඉදිරිපත් කල සාක්ෂි අනුව, පළමු චූදිත හඳුනා ගැනීම පිළිබඳ ව සාක්ෂියේ දී චූදිතයන් වෙනුවෙන් අධිකරණයේ අවධානයට යොමු කරන ලද්දේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු එම කරුණ පොලීසිය ට දුන් කට උත්තරයේ සඳහන් නොකිරීම ඌණතාවයක් ලෙසට ය. පහර දීම පිළිබඳ ව 2008.07.19 වෙනි දින සිදු කල ප්‍රකාශයේ සඳහන් නොකල කරුණකි. 01,02 චූදිතයන් වෙනුවෙන් ඌණතාවයක් ලෙස අධිකරණයේ අවධානයට යොමු කරන ලද්දේ එබැවිනි.

පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණය ට ඉදිරිපත් කල දිවුරුම් ප්‍රකාශය තමාට කියවා දුන් බවට ප්‍රකාශ කරන සාක්ෂිකරු තවත් වරෙක කියා සිටින්නේ තමාට එය කියවා නොදුන් බවයි. නමුත් ඉදිරිපත් කල දිවුරුම ප්‍රකාශයේ ඇති අත්සන තමාගේ අත්සන බව ට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු පිළිගන්නා ලදි. දිවුරුම් ප්‍රකාශයේ සඳහන්ව තිබූ භාෂාව සම්බන්ධයෙන්ද සාක්ෂිකරු විචලාය ආකාරයෙන් සාක්ෂි දී ඇත. පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු එකී දිවුරුම් ප්‍රකාශය පිළිබඳව අස්ථාවර ලෙසට සාක්ෂි ඉදිරිපත් කල ද එමගින් එම දිවුරුම් පෙත්සමේ ඇති කරුණු නොදන්නා බව හෝ තමා කියවා නොදුන් බවට කියා සිටීමෙන් ඔහු ප්‍රතිබන්ධනය වේ. මෙම දිවුරුම් ප්‍රකාශය සකස් කරන ලද්දේ තමාගේ ද උපදෙස් මත බවද මෙම සාක්ෂිකරු පිළිගෙන ඇත.

ඌණතාවයන්හි දී, අධිකරණයේ අවධානයට යොමු කල ඌණතා පිළිබඳ කරුණු පොලිස් ස්ථානයට ප්‍රකාශ නොකිරිමට හේතු තිබිය හැකිය. සමහර විට බලපෑමක් මත එය සිදු විය හැකිය. කිවූ කරුණු සටහන් නොකිරීමක් මත එය සිදු විය හැකිය. පක්ෂග්‍රාහී නිලධාරියෙක් එය සටහන් කලේ නම් එය සිදු විය හැකි ය. මේ වා සිදුවීමට ඉඩ ඇති හේතුන් විය හැකිය. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය ට දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී එවැන්නක් තිබිය නොහැකිය. පොලිස් ස්ථානයන්ට ප්‍රකාශයන් ලබා දීමේ දී පෙර සඳහන් කල පරිදි කිසිදු කරුණක් මගින් සිය ප්‍රකාශය ලබා දීමට බාධාවක් වූ බව මෙම සාක්ෂිකරු හෙළිදරව් කිරීමක් ද කර නැත. ඒ අනුව මෙම ඌණතාවයන් සාධාරනීයකරණය කල හැකි ඌණතාවයන් ලෙසට හඳුනාගත නොහැකි චෝදනාවේ මූලයට බලපාන්නා වූ ඌණතාවයන් ය. ඉහත ආකාරයට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගේ සාක්ෂියේ දී අධිකරණයේ අවධානයට යොමු කල ඌණතා අධි චෝදනාවේ අංගයන් හි මූලයටම බලපාන්නා වූ ඌණතාවයන් ය. එවැනි ඌණතා මගින් පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ සාක්ෂියට බලපෑම් ඇති කරයි.

13 MAY 2019

01,02 වූදිතයන් වෙනුවෙන් වි.01 ලෙසට ලකුණු කරන ලද්දේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කල දිවුරුම් ප්‍රකාශයයි. එකී දිවුරුම් ප්‍රකාශයේ අත්සන සාක්ෂිකරුගේ බවට ඔහු විසින් පිළිගෙන ඇත. දිවුරුම් ප්‍රකාශයේ 01 සිට 03 වූදිතයින් සහ තවත් පිරිසත් පැමිණි බවට ප්‍රකාශ කර ඇති කාරණය වැරදි බවට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු මෙම අධිකරණයේ දී පිළිගන්නා ලදි. මූලික අයිතිවාසිකම නඩුවේ දී පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගෙන ඇති ස්ථාවරය හා මෙම නඩුවේ දී ගෙන ඇති ස්ථාවරය වෙනස් බව එහි දී පැමිණිල්ලේ සාක්ෂිකරු පිළිගන්නා ලදි. වි.02 ලෙසට ලකුණු කරන ලද්දේ එම පරස්පරතාවය යි.

වි.02 ලෙසට නැවතත් පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු විසින් ඇල්පිටිය පොලිස් ස්ථානයේ දී ලබා දුන් කට උත්තරයේ කොටසක් සලකුණු කරන ලදි. එකී ප්‍රකාශය පරිදි පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ට නිලධාරීන් අත තිබූ තුවක්කු වලින් පහර දුන් බව ට ප්‍රකාශ කර ඇති කොටස පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රතික්ෂේප කරන ලදි.මෙම අධිකරණයේ ඉදිරිපත් කල සාක්ෂි අනුව ඔහුගේ ස්ථාවරය වන්නේ පැමිණි පිරිස අතර එක් අයෙකු අත පමණක් තුවක්කුවක් තිබූ අතර පහර දුන්නේ ඉන් බවයි. නමුත් වි.02 ලෙස ලකුණු කිරීමට යෙදුණු කොටස අනුව එම සාක්ෂිය හා ප්‍රකාශයේ සඳහන් කරුණු එකිනෙකට පරස්පර ය.

පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු අත්අඩංගුවට ගත් ස්ථානයට නිල ඇඳුම් සහිතව කිසිවෙකු නොපැමිණි බව ඔහුගේ ස්ථාවරයයි. එහෙත් වි.03 ලෙසට ලකුණු කල පරස්පරතාවය අනුව සාක්ෂිකරු ඊට වෙනත් ස්ථාවරයක් ද ඉදිරිපත් කර ඇත. 2013.10.15 දින මෙම නඩුවේ දී මුලින් සාක්ෂි දුන් අවස්ථාවේ සාක්ෂිකරු මෙසේ සාක්ෂි ඉදිරිපත් කර ඇත.[17]

ප්‍ර: මොනවද ඇඳගෙන හිටියේ?

උ: යුනිෆෝම් ඇඳගෙන හිටියා එක්කෙනෙක්.

ඒ අනුව මෙම නඩුවේ දී ම මුල් අවස්ථාවේ සාක්ෂි ඉදිරිපත් කල ප්‍රකාශයට පටහැනි ආකාරයෙන් ඇඳුම් පිළිබඳව පැමිණිල්ලේ සාක්ෂිකරු සාක්ෂි ලබා දී ඇත. මෙම කරුණ එකම අවස්ථාව පිළිබඳව වෙනස් ආකාරයෙන් සාක්ෂි ඉදිරිපත් කිරීමකි.

මහාධිකරණය
13 MAY 2019
බලපිටිය

වි.04 දරණ පරස්පරතාවය සලකුණු කරන ලද්දේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු වෛද්‍යවරයාට පහර දීම පිළිබඳව කරන ලද ප්‍රකාශනය හා සම්බන්ධයෙනි. එහි දී පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු වෛද්‍යවරයාට ප්‍රකාශ කර ඇත්තේ පොලිස් නිලධාරියෙක් යකඩ පොල්ලකින් පහර දුන් බව වන අතර එය මෙම අධිකරණය ඉදිරියේ සාක්ෂිකරු ලබා දුන් සාක්ෂියට පටහැනි කරුණකි. වෛද්‍යවරයාගේ සාක්ෂියේ දී අධිකරණ වෛද්‍ය වාර්තාව ට පළමු වූදිත පිළිබඳ ව ඇතුලත් වී ඇතත් ඔහුගේ පුද්ගලික සටහන් වල එවැන්නක් සඳහන් වන්නේ නැත. එහෙත් වෛද්‍යවරයා ද එකී වෙනසට හේතු ඉදිරිපත් කර ඊට සාධාරණ හේතුවක් ඇද්දැයි අධිකරණය සෑහීමට පත් කර නැත. එබැවින් පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු විසින් පලමු වූදිත විසින් තමා ට

[17] 2013.10.15 දින සටහන් පෙ.ව. 10.45 සිට පෙ.ව. 11.00 සටහන් 9 පිටුව

තුවක්කු බඳෙන් පහර දුන් බව ට වෛද්‍ය වරයා ට ප්‍රකාශ කල බව ට සඳහන්ව ඇති කරුන පිළිබඳ අධිකරණය ට සෑහීම ට පත්විය නොහැකිය.

පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ ස්ථාවරය වූයේ තමා ගෙවල් 20 ප්‍රදේශයට යන ලද්දේ රැකියාවකට සම්මුඛ පරීක්ෂණයකට යාම සඳහා බෑගයක් ඉල්ලා ගැනීමට බවයි. නමුත් මෙම සිදුවීම සම්බන්ධයෙන් පොලිස් ස්ථානයට ලබා දුන් කට උත්තරයේ දී එසේ යන යන ලද්දේ සපත්තු දෙකක් ඉල්ලා ගැනීමට ලෙස සඳහන් ව තිබීම පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු පිළි නොගත් අතර ඔහුගේ ස්ථාවරය වන්නේ එය නිවැරදි නොවන බවයි. මෙම කරුණ ද සාක්ෂිකරු ගේ ම සාක්සියේ ඇති පරස්පරතාවය කි.

පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කරන අත් අඩංගුවට ගැනීම සිදු කිරීමට පෙර ඔහුගේ පැරණි නිවස තිබූ ඉඩමේ සිටි සෙසු පුද්ගලයන් මත් පැන් පානය කලද තමා මත් පැන් පානය නොකල බව සාක්ෂිකරුගේ ස්ථාවරයයි. එහෙත් වී 06 ලෙස සලකුණු කිරීමට යෙදුනු පරස්පරතාවය ප්‍රකාරව පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු පොලිසියට ලබා දුන් ප්‍රකාශයේ දී ඔහු මත් පැන් පානය කල බවට පිලිගෙන ඇති කරුණ වි. 06 ලෙස මෙම අධිකරණයේ අවධානයට යොමු කරන ලදි. මත්පැන් පානය කිරීම හා සම්බන්ධ කාරණාවේ දී පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු, තමා මත්පැන් පානය නොකල බවට ප්‍රකාශ කල ද වරක ඔහු තමා මත් පැන් පානය කර සිටි බවට ලබා දුන් සාක්ෂිය කෙරෙහි ද අධිකරණයේ අවධානය යොමු කරන ලදි. පලමු සාක්ෂිකරු එවැනි ස්ථාවරයක සිටිය ද සාක්ෂිකරුගේ මව විසින්, තම පුතා මත් පැන් පානය කර සිටි බවට පිලිගෙන ඇත. පළමු සාක්ෂිකරු විසින් ම සැඟවීමට අත්සහ කරන්නේ එම ස්ථාවරය යි. මේ ආකාරයට සාක්ෂිකරු නඩුවේ බොහෝ කරුණු සැගවීමට එසෙ නැතහොත් වෙනස් කර සාක්ෂි දීමට කටයුතු කර ඇති බව පෙනී යයි.

අත්අඩංගුවට ගැනීම ට නිලධාරීන් පැමිණීමේ දී එම ස්ථානයේ සිටි සියලු දෙනා සාමකාමීව සිටි බව සාක්ෂිකරු ගේ ස්ථාවරයයි. නමුත් පිරිස කෑ ගසමින් සිටි කාරණය මෙම සාක්ෂිකරු ප්‍රතික්ෂේප කර ඇත. 01, 02 චූදිතයන් ගේ ස්ථාවරය වන්නේ මෙම සාක්ෂිකරු මීට පෙර සාක්ෂි දීමේ දී එම ස්ථානයේ සිටි පිරිස කෑ ගසමින් සිටි බවට අධිකරණයේ ප්‍රකාශ කර ඇති බවයි. නැවතත් වි06 ලෙස ලකුණු කරන ලද්දේ එම ප්‍රකාශය වේ. [18] (සටහන් වල වි 05 ලෙස සඳහන්ය.)

"එතන කට්ටිය කෑ ගහ ගහ බිබී සිටියා. මම එහා පැත්තේ ෆවුන්ඩේෂන් එක උඩ වාඩි වෙලා කෝල් එකක හිටියේ. ඊට පස්සෙ ඒ කට්ටිය හොඳටම කෑ ගහ ගහ හිටියේ. මම එහා පැත්තට වෙලා වාඩි වෙලා හිටියේ." මෙසේ අධිකරණය ටම ප්‍රකාශ කල කරුණ එම සාක්ෂිකරු තමා ප්‍රකාශ නොකල කරුණක් ලෙස නැවත සාක්ෂි දීමේ දී කියා පෑමට යෙදුනි.

13 MAY 2019

[18] 2013.10.15 දින සටහන් පෙරවරු 10.45 සිට 11.00 දක්වා පිටුව 05

පහර දීම හා සම්බන්ධයෙන් කාරණාවේ දී තමා ට ඉදිරිපසින් සිටි අය අතුකෝරල මහත්තයා'' ලෙස ප්‍රකාශ කල බවත්, අතුකෝරල "සර්" ලෙස ප්‍රකාශ නොකල බවත් සාක්ෂිකරුගේ ස්ථාවරයයි. වි. 08 ලෙස ලකුණු කරන ලද්දේ එසේ "සර්" ලෙස පොලිස් ස්ථානයට කියා ඇති කොටස යි. මෙම පරස්පරතාවය නොසලකා හැරිය හැකි තරමේ පරස්පරතාවයක් වේ.

මෙම සාක්ෂිකරුගෙන් වැඩිදුර ප්‍රශ්ණ කිරීමේදී සාක්ෂිකරු 2013.12.02 දින ලබා දුන් සාක්ෂි කෙරෙහි අවධානය යොමු කරන ලදි[19]

ප්‍ර: කවුද කිව්වේ අතුකෝරල කියලා නම?

උ: අතුකෝරල කියලා නම කිව්වෙ අනෙක් නිලධාරීන් දෙන්නාගෙන් එක්කෙනෙක්.

ප්‍ර: කවුද?

උ: අනෙක් නිලධාරීන් දෙන්නාගෙන් එක්කෙනෙක්.

ප්‍ර: කවුද කොයි දෙන්නාද?

උ: ජයරත්න.

ප්‍ර: ජයරත්න කිව්වේ? ඒ කියන්නේ දෙවෙනියා?

උ: ඔව්.

නමුත් දෙවෙනි චූදිත එසේ ප්‍රකාශ කල බවට වූ කරුන සාක්ෂිකරු නැවත අධිකරණය ඉදිරියේ සාක්ෂි දීමේ දී ප්‍රතික්ෂේප කරන ලද අතර වි 09 ලෙස එකී පරස්පරතාවය සලකුණු කිරීමට හේතුව වූයේ එබැවිනි.

පැමිණිල්ලේ සාක්ෂිකරු ගේ සාක්ෂි මගින් වෙඩි ශබ්ද ඇසීම පිළිබඳව කරුණු හෙලිදරව වුව ද පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගේ ස්ථාවරය වූයේ වෙඩි තැබීමක් තමා නොදුටු බව යි. ඉහත ද දක්වා ඇති පරිදි, මෙම සිද්ධියේ දී පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගේ මූලික අයිතිවාසිකම් කඩ වූ බවට වූ ස්ථාවරය ට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ශ්‍රේෂ්ඨාධිකරණය ට කල ඉල්ලීමක දී ඉදිරිපත් කල දිව්රුම් ප්‍රකාශය කෙරෙහි 01,02 චූදිතයන් කෙරෙහි අධිකරණයේ අවධානය යොමු කරන ලදි. එකී දිවුරුම් ප්‍රකාශයේ පළමු චූදිත අහසට වෙඩි තබනු සාක්ෂිකරු දුටු බවට කියා ඇති ප්‍රකාශය වැරදි බවට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු කියා සිටින ලදි. වි 10 ලෙස සලකුණු කරන ලද්දේ එම පරස්පරතාවයයි. ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු දැක්වීමේ දී වෙඩි තබනවා දුටු බවට කියා ඇති කරුණ පිලිගන්නේ නම් එය සත්‍ය විය නොහැකිය. මන්ද 03 වන චූදිත පොලිස් ස්ථානයෙන් රැගෙන එන ලද පතරොම් 30 ඔහු විසින් නැවත උප සේවයට බාර දී ඇත. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට ප්‍රකාශ කර ඇති කරුණ විය නොහැක්කක් මෙන්ම සාක්ෂිකරු ම ප්‍රකාශ කරන පරිදි තමා වෙඩි තැබීමක් දුටු බවට කියන කාරණාව අසත්‍ය වේ.

සාක්ෂිකරු පළමු අවස්ථාවේ දී සාක්ෂි දීමේ දී 2003.11.11 දින පස්වරු 12.45 ත් 1.00 ත් අතර දක්වා වූ සාක්ෂි සටහන් කෙරෙහි අවධානය යොමුකර පහර දුන් තුවක්කුවේ මීටේ ප්‍රමාණය පිලිබඳව

[19] (2013.12.02 දින 12.30 සිට 12.45 දක්වා සටහන් පිටුව 05)

ප්‍රශ්න කර සිටින ලදී. මෙම අධිකරණයේ දෙවෙනි වර සාක්ෂි දීමේ දී සාක්ෂිකරු ගේ ස්ථාවරය වූයේ තමන් තුවක්කුවෙහි මිටේ ප්‍රමාණය හරියටම නොදන්නා අතර තමා එය මැන නොබලන ලද බව යි. එබැවින් පෙර අඟල් 06 ක් පමණ පළල බව ට කියන කාරණාව මෙම සාක්ෂිකරු ප්‍රතික්ෂේප කරයි. 01, 02 චූදිතයන් වෙනුවෙන් 2013.11.11 දින සාක්ෂි කෙරෙහි සාක්ෂිකරුගේ අවධානය යොමු කරමින් එම කොටස වි.11 ලෙස සලකුනු කරන ලදී.[20] එකී කොටස මෙසේය.

ප්‍රː දැන් එතකොට ඔය ටී 56 න් පහර දුන්නේ ටී 56 මිට කොපමණ විතර පළලද?

උː අඟල් 06 ක් පළල.

ප්‍රː අඟල් 06 ක් පළල මිටකින් ගැහුවේ?

උː ඔව්

සාක්ෂිකරු ප්‍රතික්ෂේප කරන්නේ එකී ස්ථාවරයයි.

මෙම පහර දීමේ සිද්ධිය හා සම්බන්ධව සාක්ෂිකරු මුල් අවස්ථාවේ ප්‍රකාශ කළ කරුණු කෙරෙහිද අධිකරණයේ අවධානයට යොමු කරන ලදී. පහර දෙන ලද්දේ තුවක්කු මිටෙන් බවත් ඉන් ඇහැට එක පහරක් වැදුනු බවත් මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. වි 12 ලෙස ලකුණු කරන ලද පරස්පරතාවය මෙසේ ය.[21]

ප්‍රː කී පාරක් ගැහුවද තුවක්කු වලින්?

උː දෙපාරයි ස්වාමීනි. දෙවෙනි පාර තමයි මට වැදුනේ.

ප්‍රː කොහෙට කොහෙටද ගැහුවේ?

උː මෙතන බෙල්ලට වැදුනේ."

13 MAY 2019

මෙසේ ලකුණු කරන ලද පරස්පරතාවය අනුව සාක්ෂිකරු ට වැදී ඇත්තේ එක් පහරක් පමණක් වන අතර එම පහර බෙල්ල ට වැදුනු පහරකි. දෙවන වර සාක්ෂි දීමේ දී ඔහු ප්‍රකාශ කළ පරිදි බෙල්ල ට වැදී ඇත්තේ දෙවෙනි පහර වන අතර එම කරුණද මෙම පහරදීම පිළිබඳ ව සාක්ෂිකරු විචල්‍ය ලෙස සාක්ෂි ලබා දීමකි. අධිකරණය ඉදිරියේ සාක්ෂි දීමේ දී සාක්ෂිකරු දිගින් දිගට ම ප්‍රකාශ කිරීම ට යෙදුනේ තමා ට පහර දීමේ දී පහරවල් දෙකක් එල්ල කල බවත් ඉන් එකක් බෙල්ල ට ද අනෙක් පහර ඇහැට ද වැදුනු බව යි. එහෙත් වි.12 ලෙස ලකුණු කරන ලද පරස්පරතාවය අනුව ද එකී පරස්පරතාවය පහර දීමේ සිද්ධිය හා සම්බන්ධ කාරණාවේ මූලයට ම

---

[20] 2013.11.11 දින සටහන් පස්වරු 12.45 සිට 1.00 දක්වා පිටුව 07

[21] 2013.11.11 දින සටහන් පස්වරු 12.45 සිට 1.00 දක්වා 01 වෙනි පිටුව

බලපෑම හේතුවෙන් ද එම පරස්පරය සාක්ෂිකරුගේ සාක්ෂියේ විශ්වාසනීයත්වය ට ප්‍රබල ව හානිදායක පරස්පරතාවයක් වේ.

01 02 චූදිතයින් වෙනුවෙන් එසේ සලකුණු කරන ලද පරස්පරතාවයන් ට අමතරව 03 වෙනි චූදිත වෙනුවෙන් ද පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ගේ සාක්ෂියෙ හි විශ්වසනීයත්වය සම්බන්ධයෙන් හබ කර සිටින ලදී. 03 වෙනි චූදිත වෙනුවෙන් 03 වි 01[22] ලෙස ලකුණු කරන ලද්දේ, මෙම ප්‍රශ්න සහ උත්තරයි.

ප්‍රː ඒ සිද්ධිය වෙලාවේ තවත් පුද්ගලයෙක් පහර දුන්නා පිටුපස හිඳගෙන?

උː ඔව්.

ප්‍රː ඒ පුද්ගලයා අතුකෝරලද?

උː නැහැ ස්වාමීනී.

ප්‍රː තව එක්කෙනෙක් හිටියද?

උː එයාගෙ නම මට මතක නැහැ.

ප්‍රː තුන්දෙනෙක් හිටියාද?

උː නැහැ ස්වාමීනී දෙන්නෙක් හිටියා.

ප්‍රː රියදුරු සමඟ තුන්දෙනයි?

උː ඔව් ස්වාමීනී මගේ ඉස්සරහින් කවුද හිටියේ කියලා මම දැක්කේ නැහැ ස්වාමීනී ඒ වෙලාවේ මගෙත් එක්ක එතන හිටියේ දෙන්නයි.

13 MAY 2019

තුන්වෙනි චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්ණ විමසීමේ දී අධිකරණයෙන් පවා ප්‍රශ්ණ කිරීමේ දී පහර දෙන අවස්ථාවේ තිදෙනෙක් සිටි කරුණ ස්ථිර බව ට ප්‍රකාශ කරන ලද සාක්ෂිකරු 03 වි 01 ප්‍රකාශය අනුව දක්වා ඇත්තේ එම අවස්ථාවේ දෙදෙනෙකු පමණක් සිටි බව යි.

ඉහත කී පරිදි සිටි තිදෙනා පිළිබඳව මෙම සාක්ෂිකරු ප්‍රකාශ කරන ලද්දේ තමාට වම් පසින් එක් අයෙක ද ඉදිරිපසින් දෙදෙනෙකු ද සිටි බවයි. නමුත් 03 වි 01 (අ) ලෙස ලකුණු කරන ලද්දේ එදිනම සාක්ෂි සටහන්හි අවසාන ප්‍රශ්නය සහ උත්තරය යි. එය මෙසේ ය.

ප්‍රː ඉදිරිපසින් මුහුණට මුහුණලා දෙන්නෙක්?

[22] 2013.10.15 වෙනි දින සාක්ෂි සටහන් 11 වෙනි පිටුව

උ: එක්කෙනයි ස්වාමීනී. එතන ඉස්සරහ එක්කෙනයි මගේ ආසනයේ මේ පැත්තේ එක්කෙනයි.

එමගින් ද පහර දෙන අවස්ථාවේ දී සිටි පුද්ගලයින් පිළිබඳව විචල්‍ය ලෙස මෙම සාක්ෂිකරු සාක්ෂි ඉදිරිපත් කර ඇත.

මෙම සාක්ෂිකරු 2013.10.15 දින පෙරවරු 10.45 සිට 11.00 දක්වා ලබා දුන් සාක්ෂියේ 16 සහ 17 පිටු කෙරෙහි අවධානය යොමු කරමි. එම සාක්ෂියේ දී ප්‍රතික්ෂේපිත කරුණු නැවත දෙවන වරට සාක්ෂි දීමේ දී විචල්‍ය ලෙස සාක්ෂි දීම හා සම්බන්ධව එකී කරුණ අධිකරණයේ අවධානයට යොමු කරන ලදී. මෙම අධිකරණයේ සාක්ෂි දීමේ දී ම අත්අඩංගුවට ගැනීමට පෙර නිලධාරීන් පැමිණීමේ දී එක් අයෙකු පමණක් පොල්ලක් අරන් එන ලද බවට වූ ස්ථාවරයට පරස්පර විරෝධීව සාක්ෂි දෙන කාරණාව වි 02 ලෙස අධිකරණයේ අවධානයට යොමු කරන ලදී. එකී ප්‍රශ්නය සහ උත්තරය මෙසේය.

13 MAY 2019

ප්‍ර: අනෙක් අය අතේ මොනවත් තිබුනද?

උ: අනෙක් අය අතේ පොලු දෙකක් තිබුනා.

මෙම කාරණාව ද සාක්ෂිකරු දුටු බවට කියන කරුණ හා සම්බන්ධයෙන් විචල්‍ය ලෙස සාක්ෂි ඉදිරිපත් කිරීමකි.

චූදිතයන් වෙනුවෙන් අධිකරණයේ අවධානයට යොමු කරන ලද ඌණතා සහ අධිකරණය ඉදිරියේ සලකුණු කරන ලද පරස්පර විරෝධතා රාශිය කි. පොලිස් ස්ථානයට ලබා දුන් ප්‍රකාශයේ දී නියමිත කරුණු හෙළිදරව් නොවීමට ඉඩ ඇතත් එවැන්නක් සිදු වූ බවට වත් මෙම නඩුවේ සාක්ෂි මඟින් හෙළිදරව් වූයේ නැත. වි 08 දරන පරස්පරතාවය හැරුණු විට සෙසු සියලු පරස්පරතා සහ ඌණතා අධි චෝදනාවට අදාල සිද්ධිය හා සම්බන්ධයෙනි. එහි මූලය ට ම බලපාන්නා වූ පරස්පරතාවයන් සහ ඌණතාවයන් වේ.

පරස්පරතා සහ ඌණතා යම් හෙයකින් චෝදනාවක මූලයට ම බල නොපෑව ද යම් සාක්ෂියක පරස්පරතා සහ ඌණතා අධික ලෙස ඇතිවීම, එය එම සාක්ෂියේ විශ්වාසනීයත්වය හීනවීමට හේතුවන කරුණුය. මෙම නඩුවේ දී ඉහත කී වි 08 දරන පරස්පරතාවය හැරුණු විට අන් සියලු පරස්පරතා චෝදනාවට අදාල සිද්ධිය හා සම්බන්ධ මූලයට ම බලපානු ලබන අවස්ථාවක එවන් සාක්ෂියක් කෙරෙහි විශ්වාසය තබා පැමිණිල්ල විසින් නඩුව සාධාරණ සැකයෙන් තොරව

ඔප්පු කර ඇතැයි තීරණය කිරීම අවදානම් සහගත ය. පැමිණිල්ලේ සෙසු සාක්ෂිකරුවන් කැඳවන්නේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කරන සිදුවීම සනාථ කිරීමට වන අතර සාධාරණ සැකයෙන් තොරව සනාථ නොකළ සාක්ෂියක් වෙනත් සාක්ෂි මඟින් තහවුරු කළ නොහැක.

පැමිණිල්ලේ දෙවෙනි සාක්ෂිකරු හපුතන්ත්‍රීගේ විමලාවතී යන අය දීර්ඝ ලෙස මෙම නඩුවේ සාක්ෂි ලබා දුන්න ද ඇයගේ සාක්ෂිය අධි චෝදනීය වරද ලෙස දක්වෙන ක්‍රියාව දුටු සාක්ෂිකාරියක ගේ සාක්ෂියක් නොවේ. සිද්ධිය සම්බන්ධයෙන් ඇයගේ පුද්ගලික දැනීම ආරම්භ වන්නේ පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු පොලිස් ස්ථානයට රැගෙන ඒමේ දී ය. ඒ අනුව ඇයගේ සාක්ෂිය මගින් ද මෙම පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ සාක්ෂියෙ හි තහවුරු කිරීමට කාරණාවක් නැත.

මෙම නඩුවේ අධි චෝදනාව සම්පූර්ණයෙන් ම යොමුව ඇත්තේ පළමු චූදිත විසින් පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ට පහර දුන් බව ට කියන සිදුවීම මත ය. එකී පහරදීම යන කාරණාව සනාථ නොවූ අවස්ථාවක නඩුවේ අධි චෝදනාව සමස්ථ චූදිතයන්ට එරෙහි ව ම පවරා පවත්වා ගෙන යා නොහැකි වේ. චූදිතයකු වරදකරුවකු කිරීමට තරම් නොවන අවදානම් සහගත පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ සාක්ෂිය එසේ තිබිය දී පහර දුන් බවට කියන පළමු චූදිතගේ ස්ථාවරය තමා මෙම වැටලීම සඳහා සහභාගි නොවූ අයෙකු බව යි. එය පැමිණිල්ල මගින් සාක්ෂියට කැඳවූ උප සේවක නිලධාරියා මගින් ද තහවුරු කරන ලදී. මෙම පළමු චූදිත මෙම වැටලීම සඳහා සහභාගි නොවීම හුදු ප්‍රකාශයක් පමණක් නොව උප සේවයේ යොදා ඇති සටහන අනුව ද සනාථ වූ කාරණාව කි.

පැමිණිල්ල විසින් පැමිණිල්ලේ නඩුව බැලූ බැල්මට පෙනෙන පරිදි සනාථ කර ඇති බවට අධිකරණයක් සෑහීමට පත්වුවද අන්‍යස්ථානික භාවය පිළිබඳ විත්ති වාචකයක් සනාථ වූ අවස්ථාවක චූදිතයෙකු වරදකරුවෙකු කළ නොහැකිය. මෙම නඩුවේ පැමිණිල්ලේ නඩුව සාධාරණ සැකයෙන් තොරව සනාථ කර නොතිබියදී පළමු චූදිත ඉදිරිපත් කරන ලද අන්‍යස්ථානික භාවය පිළිබඳ විත්තිවාචකය පවා සනාථ වී තිබියදී පැමිණිල්ල විසින් චූදිතයන්ට එරෙහිව නඩුවේ අධි චෝදනාව සාධාරණ සැකයෙන් තොරව සනාථ කරන ලද බවට අධිකරණයට සෑහීමට පත්විය නොහැකිය.

පළමු චූදිත මෙම වැටලීම සඳහා සහභාගී නොවූ අයෙකු බවට තහවුරුව ඇත. එවන් තහවුරුවක් යටතේ ද පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු විසින් ප්‍රකාශ කරන සිදුවීම සනාථ නොවන අතර පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ සාක්ෂිය ද සාධාරණ සැකයෙන් තොරව ඉදිරිපත් වූ සාක්ෂියක් නොවේ. එවැනි අවස්ථාවක චූදිතයින් විසින් නඩුවේ පළමු හෝ දෙවන අධි චෝදනීය වරද කළ බවට පැමිණිල්ල විසින් ඔප්පු කරන ලද ලෙසට නීතිය ඉදිරියේ පිළිගත නොහැකි ය.

චෝදනාවන් සැලකීමේ දී ප්‍රධාන වශයෙන් ම පැමිණිල්ල විසින් දෙවන අධි චෝදනීය වරද පළමු චූදිත විසින් සිදු කිරිම සහ සෙසු චූදිතයන්ගේ, ඊට වූ දායකත්වය සනාථ කල යුතුය. එවැන්නක් මෙම නඩුවේ දී පැමිණිල්ල සනාථ කර නැත.

පළමු අධි චෝදනාව සැලකුව ද පනතේ දොලොස් වන වගන්තියේ ඇති අර්ථ නිරූපනය අනුව චූදිතයින් පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුට ඇඩි ශාරීරික වේදනාවක් දුන් බව සනාථ නොවේ. මෙම නඩුවට අදාල ප්‍රධාන සිදුවීම සනාථ නොකිරීම මත පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ සමස්ථ සාක්ෂියේ ම වටිනාකම හීන වන අතර එය සත්‍ය සාක්ෂියක් ලෙස අධිකරණයක් ඉදිරියේ පිලිගත නොහැකි වේ.

සාක්ෂිකරුට සිදු වූ තුවාලය කෙසේ සිදු වුවද පැමිණිල්ල වෙනුවෙන් ඉදිරිපත් කරන ලද උප සේවක නිලධාරියාගේ සාක්ෂිය අනුව ඔහු විසින් කඩිනමින් වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට පවා කටයුතු කල බවද සාක්ෂි දී ඇත. එසේම චූදිතයින් හෝ කිසිදු නිලධාරියෙකු හිතා මතා තුවාලකරුට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට කටයුතු නොකර එය පැහැර හැරි බවට ද මෙම නඩවේ දී සනාථ වී නැත. තවද සනාථ කිරීමට අපොහොසත් වුවද 2,3 චූදිතයන් තමාට බැණ වැදුණ බවට පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රකාශ කල ද එමගින් ඔහුට මානසික පීඩනයක් හෝ පීඩාවක් ඇති වූ බවට සාක්ෂිකරු කිසිදු සාක්ෂියක් ලබා දී නැත.

පළමු චූදිත විසින් තම අනාසස්ථානික භාවය සනාථ කර තිබිය දී හා පැමිණිල්ල ඉදිරිපත් කල සාක්ෂිකරුවන් මගින් ද එය හෙලිව තිබිය දී මෙන්ම පැමිණිල්ල සියනඩුව සාධාරණ සැකයෙන් තොරව සාක්ෂි ඉදිරිපත් කර සනාථ නොකිරීම හේතුවෙන් වැඩිදුරටත් විත්ති වාචික සම්බන්ධව සලකා බැලීම ද අවශය නොවේ.

ඉහත කරුණු අනුව මෙම නඩුවේ 1,2 අධි චෝදනාවන්ගෙන් 1 සිට 3 දක්වා වූ චූදිතයින් නිදොස් කොට නිදහස් කරමි.

අත්.කලේ...
නාමල් බණ්ඩාර බලල්ලේ
මහාධිකරණ විනිසුරු - බලපිටිය
2018.05.30

ඉහත සඳහන් වනුයේ බලපිටිය මහාධිකරණ නඩු අංක: එච්සීබී1242/2009 දරණ නඩුවේ 2018.05.30 දිනැති තීන්දුවෙහි සත්‍ය පිටපතක් බව සහතික කරමි.

සැකසුවේ
සැසඳුවේ
ලදුපත් අංකය: ඔ/24-749478
2019.05.06

13 MAY 2019
බලපිටිය

රෙජිස්ට්‍රාර්
රෙජිස්ට්‍රාර්
මහාධිකරණය, බලපිටිය